**අනුරාධපුර 04 වන සැසි වාරයේ 05 වන සභා වාරයේ සංක්ෂිප්ත වාර්තාව - 2018/08/10**

සහභාගීත්වය -

| | | | |
|---|---|---|---|
| 01. | එච්.පී. සෝමදාස මැතිතුමා | - | ගරු නගරාධිපති |
| 02. | එම්.ඩබ්. බුද්ධික ප්‍රේමදාස මැතිතුමා | - | ගරු නියෝජ්‍ය නගරාධිපති |
| 03. | ආනන්ද දහනායක මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 04. | ආර්.ඩී.කේ. සුසිල් තිලකරත්න මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 05. | ඒ.එම්.පී. අන්සාර් මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 06. | නලීන් සංජීව සිරිවර්ධන මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 07. | දුමිදු දයාසෙන් රූටියල මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 08. | එල්.ජී. ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 09. | ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී. වීමුක්ති රණවීර මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 10. | සුපිනි සඳමාලී මැතිනිය | - | ගරු නාගරික මන්ත්‍රී |
| 11. | නදීර ප්‍රභාත් ධර්මදාස මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 12. | එස්.ආර්.ඒ. සුරංගි රේණුකා සමරතුංග මැතිනිය | - | ගරු නාගරික මන්ත්‍රී |
| 13. | එම්.ඩී.කේ. විනෝදනී විජේසූරිය මැතිනිය | - | ගරු නාගරික මන්ත්‍රී |
| 14. | කේ.පී. සචිනි නිමේෂා මැතිනිය | - | ගරු නාගරික මන්ත්‍රී |
| 15. | කේ.එච්. ඉන්දික අරුණ කුමාර මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 16. | නීතීඥ පේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 17. | ජේ.එම්. සමන් ප්‍රියන්ත ජයවර්ධන මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 18. | රශ්මික ගමආරච්චි මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 19. | ඩී. ජී. පේමදාස මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 20. | ජී.ඒ. ශිවන්ත මලික් කුමාර මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 21. | රෝෂාන් ඉස්මත් බුහාරි මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 22. | ආර්.ඒ. විමල් රවින්ද්‍ර රණසිංහ මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 23. | නීතීඥ කේ.එස්.ටී. නිර්මලි ප්‍රියදර්ශනි මැතිතුමිය | - | ගරු නාගරික මන්ත්‍රී |
| 24. | කේ.ඒ. ඉන්ද්‍රානි මැතිතුමිය | - | ගරු නාගරික මන්ත්‍රී |
| 25. | ඩබ්.ජී.සී.කේ. ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 26. | ඊ.පී. අසේල ඉන්දික විජේසිංහ මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 27. | එච්.බී. සීතා හේරත් මැතිනිය | - | ගරු නාගරික මන්ත්‍රී |
| 28. | එම්.එස්.එම්. අල් ෆාරීස් මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 29. | ඩබ්.එම්.එස්.එල්. විජේසිංහ මහතා | - | සභා ලේකම් |

නොපැමිණීම -

| | | | |
|---|---|---|---|
| 01. | නීතීඥ රංජිත් රාජකාරුණා මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |

සභා ලේකම් ඩබ්.එම්.එස්.එල්. විජේසිංහ මහතාගේ ආරාධනාවෙන් අනතුරුව ගරු නගරාධිපති එච්.පී. සෝමදාස මැතිතුමා විසින් 04 වන සැසි වාරයේ 05 වන මහා සභා රැස්වීමේ කටයුතු 2018/08/10 වන දින පෙ.ව. 10.00 ට ආරම්භ කරන ලදී.

***01. i.<u>2018/07/13වන දින පැවති මහා සභාවේ වාර්තාව සම්මත කර ගැනීම.</u>***

නාගරික මන්ත්‍රී ගරු ආනන්ද දහනායක මැතිතුමාගේ යෝජනාවෙන් සහ නියෝජ්‍ය නගරාධිපති ගරු ඩබ්.එම්. බුද්ධික ප්‍රේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් 2018/07/13 වන දින පැවති මහා සභාවේ වාර්තාව සභා සම්මත විය.

**ii. 2018/07/20 වන දින පැවති විශේෂ මහා සභාවේ සභා වාර්තාව සම්මත කර ගැනීම**

නියෝජ්‍ය නගරාධිපති ගරු එම්.ඩබ්. බුද්ධික ප්‍රේමදාස මැතිතුමාගේ යෝජනාවෙන් සහ නාගරික මන්ත්‍රී ගරු එම්.පී.එම්. අන්සාර් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් 2018/07/30 වන දින පැවති විශේෂ මහා සභාවේ වාර්තාව සභා සම්මත විය.

**<u>02. සභාවට ආමන්ත්‍රිත පෙත්සම් පැමිණි නිවේදන ඉදිරිපත් කිරීම.</u>**

i. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩී.කේ. විනෝද්නි විජේසූරිය මැතිතුමිය විසින් දැනට සාමාජිකත්වය දරණ කාන්තා කටයුතු , පූර්ව ළමාවිය ළමා හා මාතෘ සායන පිළිබඳ ස්ථාවර කමිටුවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වන බව ගරු සභාව වෙත දන්වා සිටිම.

- ❖ ඉහත ඉල්ලා අස්වීමෙන් ඇතිවන එම කමිටුවේ සාමාජිකත්ව පුරප්පාඩුව සඳහා ගරු නාගරික මන්ත්‍රී විමල් රවින්ද්‍ර රණසිංහ මැතිතුමා නව සාමාජිකත්වයට පත් කිරිමට අදාලව යෝජනා ගරු නාගරික මන්ත්‍රි සුසිල් තිලකරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කළ අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී සුරංගි ආර්. සමරතුංග මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ii. ගරු නාගරික මන්ත්‍රී නීතීඥ පේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා විසින් උසාවි වටරවුම පදික වෙළඳසැල් ඉවත් කිරිම සම්බන්ධයෙන් වු එම පදික වෙළඳුන් විසින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සභා ගත කරන ලදී.

RD එක මගින් මෙම පදික වෙළඳසැල් ඉවත් කිරීම් සිදු කරගෙන යනු ලබන බව ගරු නගරාධිපතිතුමා විසින් ප්‍රකාශ කළ අතර, පදික වෙළඳුන් සඳහා කඩ 12 වම්පත පිහිටි භූමිය වෙළඳුන් 75 දෙනෙකුට පමණ ප්‍රමාණවත් වන පරිදි අමානෝ ශීට් යොදා හට් එකක් සකස් කර එම ස්ථානයට වෙළඳුන් යොමු කිරිමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී.

ඉහත කටයුත්ත හොඳ බවත්, RD එක මේ සඳහා මැදිහත් වීමට තමා විරුද්ධ බවත් නාගරික මන්ත්‍රී නීතීඥ පේමසිරි හෙට්ටිආරච්චි මහතා විසින් ප්‍රකාශ කළ අතර. මහා මාර්ග ආඥා පනතට අනුව පාරවල්, රිසිවේෂන්, වටරවුම් සියල්ල මහා නගර සභාවට අයිති බව ප්‍රකාශ කළ අතර, ඒ අනුව ක්‍රියා කළ යුතු බවට ප්‍රකාශ කරන ලදී.

**<u>03. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ</u>** - නැත

## 04. යථා පරිදි කල් දී ඇති යෝජනා.

### *4.1 ගරු නගරාධිපතිතුමා විසින් කරනු ලබන යෝජනාව.*

*ව්‍යාපෘති සැලසුම් කටයුතු සඳහා නිලධාරියෙකු බඳවා ගැනීම.*

මහා නගර සභාව මගින් ඉදිරියේ දී සිදු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතින් වන

I. පැරණි නාගරික කොමසාරිස් නිල නිවාස භූමියේ වෙළඳ සංකීර්ණ සංවර්ධන ව්‍යාපෘතිය
II. පළාත් සභා ගොඩනැගිල්ල ඉදිරිපිට නිල නිවාස ඉවත් කර ඉදි කිරීමට අපේක්ෂිත ගොඩනැගිලි සංකීර්ණය
III. සූර්ය විදුලි බල ව්‍යාපෘතින්
IV. මහජන පොළ ඉදිරි සැලසුම් සකස් කිරීම
V. කුම්බිච්චන්කුලම වැව් බැම්මට යාබද හෙල බොජුන් දේශීය ආහාර වෙළඳ කලාපය

සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මෙන්ම දේශීය, විදේශීය ආයතන හා සම්බන්ධව කටයුතු කිරීමේ දී සුදුසු ආකාරයේ ව්‍යාපෘථී සැලසුම් කිරීම, හා නාගරික සැලසුම්කරන කටයුතු සඳහා සැලසුම් කාර්යයයේ අත්දැකීම් සහිත සුදුසුකම් ලත් නිලධාරියෙකුගේ සේවය අවශ්‍යව පවති.

මේ සඳහා සුදුසු නිලධාරියෙකු ලෙස උතුරු මැද පළාත් සභාවේ සැලසුම් ලේකම්වරයෙකු ලෙස කටයුතු කර විශ්‍රාම ගෙන සිටින එන්.එම්.යූ. නවරත්න මහතා තාවකාලික පදනම මත බඳවා ගැනීම සඳහා නිර්දේශ කර යෝජනාව ඉදිරිපත් කරනු ලබන අතර, සභා පත්වීමක් ලෙස ව්‍යාපෘති සැලසුම් නිලධාරියෙකු සේවයේ යොදවා ගැනීමටත්, එම අයට සුදුසු දීමනාවක් ලබා දීමටත් ගරු සභාව වෙත කරනු ලබන යෝජනාව.

- ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, ඒකච්ඡන්දයෙන් සභා සම්මත විය.

### 4.2 ගරු නගරාධිපතිතුමා විසින් කරනු ලබන යෝජනාව.

*මහා නගර සභාව සතු දිවා සුරැකුම් මධ්‍යස්ථානය හා පෙර පාසල සඳහා පාලිකාවන් , සහය පාලිකාවන් සහ සනීපාරක්ෂක කම්කරුවන් දීමනා පදනම මත බඳවා ගැනීමට කරනු ලබන යෝජනාව.*

අනුරාධපුර මහා නගර සභාව විසින් ක්‍රියාත්මක කර පවත්වාගෙන යනු ලබන දිවා සුරැකුම් මධ්‍යස්ථානය සහ පෙර පාසල සඳහා පාලිකා තනතුර, සහය පාලිකා තනතරු හා සනීපාරක්ෂක කම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් පරික්ෂා කර පහත සඳහන් තනතුරු සඳහා වන කාර්ය මණ්ඩලය දීමනා පදනම මත බඳවා ගැනීමෙන් අනතුරුව සේවයේ යොදවා ගැනීමට කරනු ලබන යෝජනාව.

**දිවා සුරැකුම් මධ්‍යස්ථානය සඳහා**

I. ප්‍රධාන පාලිකා - ඩබ්.කේ. අයේෂා ප්‍රසාදිනි මෙය, 203, පරාක්‍රම මාවත, විජයපුර, අ/පුර
II. සහය පාලිකා - සඳමාලි වන්නිආරච්චි මිය, දීපානි පාසල් මාවත, වන්නිතම්මැන්නාව, අ/පු
උදයංගනි කුමාරි මිය, 72/2, දහයියාගම හන්දිය, අ/පුර

III. සනීපාරක්ෂක කම්කරුවන් - එච්.එම්. සෙනෙවිලතා, 581/146, තම්මැන්නාකුලම, අ/පුර

**<u>පෙර පාසැල සඳහා</u>**

I. පෙර පාසැල් ප්‍රධාන පාලිකා - ඩී.ඩබ්.ඒ. සංජීවනි උදිතා මධුෂානි, 496, 2 පියවර, දේවානම්පියතිස්සපුර, තිසාවැව, අ/පුර

II. පෙර පාසැල් සහය පාලිකා - නදිකා ප්‍රියදර්ශනි මිය, 19, යුගල නිවාස, එල්.එස්. පාර, අ/පුර
නිරෝෂික රසිකානි මිය, 2278, 3 පියවර, අ/පුර

- ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.පී.එම්. අන්සාර් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර ඒකච්ඡන්දයෙන් සභා සම්මත විය.

**<u>4.3 ගරු නාගරික මන්ත්‍රී කේ.පී. සචිනි නිමේෂා මැතිනිය විසින් කරනු ලබන යෝජනාව.</u>**

මහා නගර සභා බල ප්‍රදේශයේ සංවර්ධන තොරතුරු නගර සභාව තුළ පුළුල් තිරයක් මගින් ප්‍රචාරණය සඳහා සංනිවේදන ඒකකයක් පිහිටුවීමට කරනු ලබන යෝජනාව.

යෝජනාවේ සැලැස්ම සභාවට ඉදිරිපත් කරන ලදී. ( ඇමුණුම - 01 )

- ඉහත යෝජනාව නාගරික මන්ත්‍රී ගරු සුරංගි ආර්. සමරතුංග මැතිතුමිය විසිස් ස්ථිර කරන ලද අතර, වැඩි ඡන්ද 17 කින් සභා සම්මත විය.

ගරු නාගරික මන්ත්‍රී ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා.

ගරු නගරාධිපතිතුමනි, සංවර්ධනය යනු ප්‍රදර්ශනාත්මක දෙයක් නොවේ. සංවර්ධනය කියන දේ ඇඟට දැනෙන්න ඕනේ. පාරේ යනකොට දූවිලි නානවා. ව්‍යාපාරක් කරනවා නම් ව්‍යාපාරිකයා දූවිලි කනවා. කාණු ගඳ ගහනවා. මේවා තමයි සංවර්ධනය වෙන්න ඕනේ. නැතුව, නිකං ගොඩනැගිල්ලක් හඳලා ප්‍රදර්ශණයක් පෙන්නලා, මොනවා හරි බෙදලා මේවා කරලා වැඩක් නෑ. පොඩ්ඩක් ගිහිල්ලා බලන්න නගරයේ අතුරු පාරවල් කිසි දෙයක් හඳලා නෑ. මේවා තමයි පෙන්නන් ඕනේ. නගර සභා සීමාව තුල බදු ගෙවන ව්‍යාපාරිකයෝ ඉන්නවා, ජනතාව ඉන්නවා. ඒ අයට කිසිම පහසුකමක් නෑ.

**සභාවේ ඝෝෂා...**

**<u>ගරු නාගරික මන්ත්‍රී ආනන්ද දහනායක මැතිතුමා.</u>**

ගරු නාගරික මන්ත්‍රී සචිනි නිමේෂා මන්ත්‍රීතුමිය ගෙන ආ යෝජනාව ඉතාමත් කාලෝචිත යෝජනාවක් වන බවත්, එය ඉතා අගය කළ යුතු බවත් ප්‍රකාශ කරමින් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන බවට ප්‍රකාශ කර සිටින ලදී.

**<u>ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා.</u>**

ගරු නාගරික මන්ත්‍රී සචිනි නිමේෂා මන්ත්‍රීතුමිය විසින් ගෙන එන ලද යෝජනාව කාලෝචිත යෝජනාවක් බවට ප්‍රකාශ කරමින්, ඉදිරියට තවත් ශක්තිමත් වෙමින්, නොසැලී ඉදිරියට ගොස් තම කාර්යයන් ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලීමක් කරමින් මෙම යෝජනාවට තමාගේ සහයෝගය ලබා දෙන බවට ප්‍රකාශ කර සිටින ලදී. තවද, ඇතැම් අය පුරුද්දක් වශයෙන් සියලුම දේ සඳහා අකුල් හෙලන බවත්, ඒ දේවල් සඳහා සාර්ථකව මුහුණ දී ඉදිරි ගමන යා යුතු බවට ද ප්‍රකාශ කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එල්.ජී. ප්‍රේමචන්ද්‍ර මැතිතුමා.**

ගරු නාගරික මන්ත්‍රී සචිනි නිමේෂා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ඉතාමත් කාලෝචිත හා අවශ්‍යම යෝජනාවක් බවට ප්‍රකාශ කරමින් කාර්යය සාර්ථක කර ගැනීමට තම සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී.

තවද ජනතා විමුක්ති පෙරමුනේ ගරු නාගරික මන්ත්‍රීවරුන් විසින් එල කර ඇති පුවත්පත් ප්‍රකාශයක් පිළිබඳ අදහස් දැක්වූ අතර, එම පදනම් විරහිත ප්‍රකාශ කිරීම හා මඩ ප්‍රචාර, මාධ්‍ය සංදර්ශණ පැවැත්වීම පදනම් විරහිත චෝදනා නොපවත්වන ලෙසත් ඉල්ලීමක් කරන අතර, මාධ්‍ය නිදහස දේශපාලනය සඳහා නිසි පරිදි යොදවා ගන්නා ලෙසත් ඉල්ලීමක් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී අසේල ඉන්දික මැතිතුමා.**

ගරු නගරාධිපතිතුමනි, මෙම යෝජනාව සන්නිවේදනය ගෙන්න හදන එක බොහොම හොඳ යෝජනාවක්. අපේ කීර්ති මන්ත්‍රීතුමා කිව්වා වගේ අපේ සංවර්ධනය මිනිස්සුන්ට දැනේන්න ඕනේ. ඒ කේ කිසිදු ප්‍රශ්ණයක් නෑ. ඔබතුමාලා මේ නගර සභාවේ තියන කාර්ය භාරය ජනතාවට දෙන්න කටයුතු කරනවා. අපි බලමු අපි බුද්ධිමත් සංවාදයක් නේ කරගෙන යන්න ඕනේ. මේක හරිද වැරදිද වඩා යහපත් ද කියන කරුණු පිළිබඳ ...

**සභාවේ ඝෝෂා .....**

අපි යම් යම් විවේචන එල්ල කරනවා. එතකොට මේ පැත්තෙන් කියනවා නෑ. එහෙම නෙවෙයි. මීට වඩා නගර සභාවෙන් කාර්ය භාරය ගෙනියනවා කියලා. එතකොට ජනතාව තීන්දු කරයිනේ. අපි අතර වෙන්න ඕනේ බුද්ධිමත් සංවාදයක් නේ. ජනතාව තීන්දු කරයි කෝකද ඇත්ත කෝක ද හොඳ කියලා තීරණය කරන එක හොඳයි.

**ගරු නගරාධිපතිතුමා.**

දැන් ඔබතුමා පුරසබේ ඔබ නොදත් දේ කියලා දාලා තියනවා නගරාධිපති පෞද්ගලික ලේකම්ට 20000.00 ක් දෙනවා. සම්බන්ධිකරණ ලේකම්ට 150000.00 ක් දෙනවා කියලා ඒ ඔක්කොම කියලා ගරු නගරාධිපතිතුමාගේ දීමනාව මෙච්චරයි කියලා තියනවා. මේක මගේ දීමනාව නෙවෙයි මේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ දීමනාව.

**ගරු නාගරික මන්ත්‍රී අසේල ඉන්දික මැතිතුමා.**

ගරු නගරාධිපතිතුමා.. අපි ආමන්ත්‍රණය කරන්නේ ජනතාව.. එ් අවස්ථාවේ දී ඔබතුමාලාගේ පැත්තෙන් යන ගමන යන්න. අපි කියන්නේ අපි ප්‍රකාශයක් කරා නම් අපි ඒ වගකීම ගන්නවා.

ඒ අනුව, අපි මේ ගෙනආ යෝජනාව බලමු කොහොමද ජනතාව අතරට යන්නේ කියලා. දැන් නියෝජ්‍ය නගරාධිපතිතුමා කිව්වනේ අපි හැමදේටම අකුල් හෙළනවා කියලා. එහෙම නෑ. නගර සභාවෙන් වෙන කාර්යය භාරයේ අඩුවක් තියනවා නම් ජනතාව අතරට යන එක ඒක පිළිගන්න එක ඒ සඳහා සුදුසු වැඩපිළිවෙලක් යොදන්න. ඒ සඳහා අපි කිසිඳු විරෝධතාවයක් එල්ල කරන්නේ නෑ.

ඉහත යෝජනා වැඩි ඡන්ද 17 කින් සභා සම්මත විය.

**4.4 ගරු නාගරික මන්ත්‍රී කේ.පී. සචිනි නිමේෂා මැතිනිය විසින් කරනු ලබන යෝජනාව.**

පරිසර හිතකාමී විසිතුරු හරිත ඇසුරුම් නිර්මාණය තුලින් ප්‍රජාව තුල ස්වයං රැකියා අවස්ථා බහුල කරමින්, ප්‍රජාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් විසිතුරු හරිත ඇසුරුම් නිර්මාණ ව්‍යාපෘතිය හා වැඩමුළුවක් පැවැත්වීමට කරනු ලබන යෝජනාව.

ව්‍යාපෘති වාර්තාව සභා ගත කරන ලදී ( ඇමුණුම - 02 )

ඉහත යෝජනාව තමා ඉතා අගය කරනු ලබන බවත් ඒ සඳහා තම සහයෝගය නොමඳව ලබා දෙන බවත් ගරු නාගරික මන්ත්‍රී එල්.ජී. ප්‍රේමචන්ද්‍ර මැතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

- ❖ ඉහත යෝජනාව නාගරික මන්ත්‍රී ගරු විනෝදනි විජේසූරිය මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර, වැඩි ඡන්ද 18 කින් සභා සම්මත විය.

**05. ස්ථාවර කමිටු සම්මත කර ගැනීම.**

5.1. 2018/07/17 වන දින පැවති මුදල් පිළබඳ ස්ථාවර කමිටුවේ වාර්තාව සම්මත කර ගැනීම. ගරු නියෝජ්‍ය නගරාධිපති එම්.ඩබ්. බුද්ධික ප්‍රේමදාස මැතිතුමාගේ සහ ගරු නාගරික මන්ත්‍රී එම්.පී.එම්. අන්සාර් මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයන් ඉදිරිපත් විය.

- ❖ ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමා විසින් පිටුව අංක 01 විෂය අංක 01 සම්බන්ධයෙන් කරුණු විමසා සිටි අතර, පොසොන් කාලසීමාවට අදාල ඉන්ධන නිකුත් කිරීම් හේතුවෙන් බිල්පත් අගයන් සාමාන්‍ය අගයන් වලට වඩා වැඩි වී ඇති බව ගරු නගරාධිපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

- ❖ විෂය අංක 44 පිළිබඳ කරුණු විමසා සිටි අතර, ඊට වෙන් කර ඇති මුදල් ප්‍රමාණය වැඩි බව ප්‍රකාශ කරන සිටින ලදී.

- ❖ ගරු නාගරික මන්ත්‍රී එල්.ජී. ප්‍රේමචන්ද්‍ර මැතිතුමා විසින් පහත සඳහන් විෂය අංක යටතේ කරුණු පැහැදිලි කරන ලෙස ඉල්ලීමක් කරන ලදී.
  විෂය අංක 05, 06, 07 ,
  ඒ අනුව විෂය අංක 07 පහත සඳහන් පරිදි සංශෝධනය විය.

7. සභාවේ ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් පොසොන් තාවකාලික වැසිකිලි ඉදිකිරීම් ද්‍රව්‍ය සහ ට්‍රැක්ටර් ට්‍රේලර් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් රුපියල් 54,2850.00 ක මුදල ඔලිම්පික් හාඩ්වෙයාර් වෙත ගෙවීම පිළිබඳ සාකච්ඡා කළ අතර, අයිතම අංක 01 යටතේ දක්වා ඇති ද්‍රව්‍ය

පිළිබඳ විස්තර අපහැදිලි බැවින් එය නිරවුල් කර ඉදිරි මුදල් ස්ථාවර කමිටුවට ඉදිරිපත් කිරීමට තීරණය විය.

| අනු අංකය | ද්‍රව්‍ය විස්තරය | ඒකක මිල | ප්‍රමාණය | මුළු මුදල |
|---|---|---|---|---|
| 1 | Aluminum Sheet 6'' | 360.00 | 350 | 126,000.00 |
| 2 | Channel Bar 1 1/2'' x 3'' | 6,500.00 | 40 | 260,000.00 |
| 3 | Angle Iron | 3,400.00 | 16 | 54,400.00 |
| 4 | Flat Iron | 1,950.00 | 1 | 1,950.00 |
| 5 | Shaften 1 | 350.00 | 6 | 2,100.00 |
| 6 | Flat Iron Bar 1 1/4 x 1/4 | 1,750.00 | 6 | 10,500.00 |
| | Angle Iron 2x2x5.5 | 2,950.00 | 2 | 5,900.00 |
| 7 | Centret Coat Sheet 1/8 | 16,500.00 | 4 | 66,000.00 |
| 8 | Hose 4'' | 320.00 | 50 | 16,000.00 |
| total | | | | 542,850.00 |

❖ ගරු නාගරික මන්ත්‍රී අසේල ඉන්දික මැතිතුමා විසින් පහත සඳහන් විෂය අංක සම්බන්ධයෙන් කරුනු පැහැදිලි කිරීම් කරන ලෙස ගරු නගරාධිපතිතුමා වෙතින් ඉල්ලා සිටින ලදී.
විෂය අංක 03, 04,07,08,09,10,11,14,15,17,20,28,33,34,35

පිටුව අංක 03 විෂය අංක 03 පහත සඳහන් පරිදි සංශෝධනය කරන ලදී.

3. මහජන ක්‍රීඩාංගනයේ පැති විකට්ටුවක් ඉදිකිරීම පිළිබඳව සාකච්ඡා කළ අතර, ක්‍රිකට් පාලක මණ්ඩලයෙන් භාණ්ඩ ලබා ගැනීමටත්, එකී භාණ්ඩ ලැබුණු පසු සෘජු ශ්‍රමය යටතේ අදාල කාර්යය ඉටු කිරීමට තීරණය විය.

ඒ අනුව විෂය අංක 15 පහත සඳහන් පරිදි සංශෝධනය විය.

15. අනුරාධපුර වලව්වත්ත, රාමකැලේ අංක 110 ලිපිනයේ පදිංචි එල්.ආර්. නිලන්ති මහත්මිය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් තම නිවසේ වහලය සෙවිලි කර ගැනීම සඳහා සෙවිලි ශීට් 20 ක් ලබා දෙන ලෙස ගරු නගරාධිපතිතුමා වෙතින් කර ඇති ඉල්ලීම පිළිබඳ සාකච්ඡා කළ අතර ග්‍රාම නිලධාරි වාර්තාවක් ලබා ගෙන, අඩි 08 සෙවිලි ශීට් 10 ක් හා අඩි 10 සෙවිලි ශීට් 10 ක් ද්‍රව්‍යාධාර ලෙස ලබා දීමට තීරණය විය.

❖ ගරු නාගරික මන්ත්‍රී නීතීඥ ජේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා විසින් පහත සඳහන් විෂය අංක සම්බන්ධයෙන් කරුනු පැහැදිලි කිරීම් කරන ලෙස ගරු නගරාධිපතිතුමා වෙතින් ඉල්ලා සිටින ලදී.
විෂය අංක 09,12,13,27,28,30,38,44,45

විෂය අංක 28 සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී නීතීඥ ජේමසිරි හෙට්ටආරච්චි මැතිතුමා විසින් ඉහත යෝජනාව සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගත යුතු බවට යෝජනා කරන ලද අතර, ගරු නගරාධිපතිතුමා විසින් මහා නගර සභා ආඥා පනතට අනුව සභාවට බල පැවැත්වෙන පරිදි පත්වීම් ලබා දීමට හැකියාව ඇති බව ප්‍රකාශ කරන ලදී. ඒ අනුව, පළාත් පාලන කොමසාරිස් ගේ අනුමැතිය යටතේ අදාල වැඩ බැලීමේ පත්වීම් ලබා දීමට තීරණය විය.

- ගරු නාගරික මන්ත්‍රී ඉන්දික අරුණ කුමාර මැතිතුමා විසින් පහත සඳහන් විෂය අංකයන් යටතේ කරුණු පැහැදිලි කිරීම් සිදු කළ අතර, ඇතැම් යෝජනා කරු දැක්වීමෙන් අනතුරුව ඇතැම් තීරණ සංශෝධනය විය.

  විෂය අංක 11,38,44,46,

- ගරු නාගරික මන්ත්‍රී සුරංගි ආර්. සමරතුංග මැතිතුමිය විසින් පිටුව අංක 06 විෂය අංක 12 පිළිබඳ කරුණු විමසීමක් කරන ලදී.

- ගරු නාගරික මන්ත්‍රී ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා

  විෂය අංක 08,09,10,11,12 වැනි යෝජනා එන විට ස්ථාවර කමිටු හරහා ඉදිරිපත් වී යම් මුදලක අගයක් සමඟ ඉදිරිපත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර, ඉදිරි මස සිට ඒ අනුව කටයුතු කිරීමට තීරණය විය.

- ගරු නාගරික මන්ත්‍රී සීතා හේරත් මැතිතුමිය විසින් කරුණු ඉදිරිපත් කරමින් විෂය අංක 12 යටතේ ලබා දෙන ද්‍රව්‍යාධාර සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන බවත්, සෑම කොට්ඨාශයකම මෙවැනි ස්වයං රැකියා ආරම්භ කිරීමට හැකියාව ඇති නමුත් මුදල් නොමැති පිරිස් සිටින බවට කරුණු ඉදිරිපත් කළ අතර, මීට වඩා ඒ මුදලේ ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් වීම කළ යුතු බවට ප්‍රකාශ කරන ලදී.

  මුදල් පිළිබඳ ස්ථාවර කමිවාර්තා සම්මත කර ගැනීම සඳහා ඡන්දය විමසීම.

| | | | |
|---|---|---|---|
| 01. | එච්.පී. සෝමදාස මැතිතුමා | - | පක්ෂව |
| 02. | එම්.ඩබ්. බුද්ධික ප්‍රේමදාස මැතිතුමා | - | පක්ෂව |
| 03. | ආනන්ද දහනායක මැතිතුමා | - | පක්ෂව |
| 04. | ආර්.ඩී.කේ. සුසිල් තිලකරත්න මැතිතුමා | - | පක්ෂව |
| 05. | ඒ.එම්.පී. අන්සාර් මැතිතුමා | - | පක්ෂව |
| 06. | නලීන් සංජීව සිරිවර්ධන මැතිතුමා | - | පක්ෂව |
| 07. | දුමිඳු දයාසෙන් රුවියල මැතිතුමා | - | පක්ෂව |
| 08. | එල්.ජී. ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | - | පක්ෂව |
| 09. | ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී. වීමුක්ති රණවීර මැතිතුමා | - | පක්ෂව |
| 10. | සුපුනි සඳමාලී මැතිනිය | - | පක්ෂව |
| 11. | නදීර ප්‍රභාත් ධර්මදාස මැතිතුමා | - | පක්ෂව |
| 12. | එස්.ආර්.ඒ. සුරංගි රේණුකා සමරතුංග මැතිනිය | - | පක්ෂව |
| 13. | එම්.ඩී.කේ. විනෝදනි විජේසූරිය මැතිනිය | - | පක්ෂව |
| 14. | කේ.පී. සචිනි නිමේෂා මැතිනිය | - | පක්ෂව |
| 15. | කේ.එච්. ඉන්දික අරුණ කුමාර මැතිතුමා | - | විෂය අංක 01,04,32,43 එකඟව හා අනිත් සියලු කරුණු සඳහා නිහඬයි |

16. නීතීඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා - විෂය අංක 01,04,32,43 එකඟව හා අනිත් සියලු කරුණු සඳහා නිහඬයි

17. සමන් ප්‍රියන්ත ජයවර්ධන මැතිතුමා - විෂය අංක 01,04,32,43 එකඟව හා අනිත් සියලු කරුණු සඳහා නිහඬයි

18. රශ්මික ගමආරච්චි මැතිතුමා - විෂය අංක 01,04,32,43 එකඟව හා අනිත් සියලු කරුණු සඳහා නිහඬයි

19. ඩී. ජී. ප්‍රේමදාස මැතිතුමා - විෂය අංක 01,04,32,43 එකඟව හා අනිත් සියලු කරුණු සඳහා නිහඬයි

20. ජී.ඒ. ශිවන්ත මලික් කුමාර මැතිතුමා - ඡන්දය විමසන අවස්ථාවේ දී සභාවට පැමිණ නොමැත ( පැමිණි වේලාව පෙ.ව. 12.05 )

21. රෝෂාන් ඉස්මත් බුහාරි මැතිතුමා - විෂය අංක 01,04,32,43 එකඟව හා අනිත් සියලු කරුණු සඳහා නිහඬයි

22. ආර්.ඒ. විමල් රවින්ද්‍ර රණසිංහ මැතිතුමා - විෂය අංක 01,04,32,43 එකඟව හා අනිත් සියලු කරුණු සඳහා නිහඬයි

23. නීතීඥ කේ.එස්.ටී. නිර්මලි ප්‍රියදර්ශනි මැතිතුමිය - විෂය අංක 01,04,32,43 එකඟව හා අනිත් සියලු කරුණු සඳහා නිහඬයි

24. කේ.ඒ. ඉන්ද්‍රානි මැතිතුමිය - විෂය අංක 01,04,32,43 එකඟව හා අනිත් සියලු කරුණු සඳහා නිහඬයි

25. ඩබ්.ජී.සී.කේ. ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා - 01,06,07,14,16,17,18,19,20,21,22,24,27,28,29,30,31,33,34,35,36,41,42,43,44,47,48-වැලකීසිටීම, 02,03,04,08,09,10,11,12,15,28,46, විරුද්ධයි, 05,13,23,25,26,32,37,38,39,40,43,45,49 - එකඟයි.

26. කේ.පී. අසේල ඉන්දික විජේසිංහ මැතිතුමා - 01,06,07,14,16,17,18,19,20,21,22,24,27,28,29,30,31,33,34,35,36,41,42,43,44,47,48-වැලකීසිටීම, 02,03,04,08,09,10,11,12,15,28,46, විරුද්ධයි, 05,13,23,25,26,32,37,38,39,40,43,45,49 - එකඟයි.

27. එච්.බී. සීතා හේරත් මැතිනිය - 01,06,07,14,16,17,18,19,20,21,22,24,27,28,29,30,31,33,34,35,36,41,42,43,44,47,48-වැලකීසිටීම, 02,03,04,08,09,10,11,12,15,28,46, විරුද්ධයි, 05,13,23,25,26,32,37,38,39,40,43,45,49 - එකඟයි.

28. එම්.එස්.එම්. අල් ෆාරීස් මැතිතුමා - ඡන්දය විමසන අවස්ථාවේ දී සභාවේ නොසිටින ලදී.

- පක්ෂව ඡන්දය ලබා දීම - 14
- විරුද්ධත්වය සහ පක්ෂව හා ඡන්දය ලබා දීමෙන් වැලකි සිටීම - 12
- සභා ගර්භයේ නොසිටීම - 02
- නොපැමිණීම - 01

ඉහත පරිදි ඡන්දය ප්‍රකාශ කිරිමෙන් අනතුරුව මුදල් ස්ථාවර කමිටු වාර්තා වැඩි ඡන්ද 14 න් සභා සම්මත විය.

**5.2 2018/07/09 දින පැවති සෞඛ්‍ය , ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ වාර්තාව සම්මත කර ගැනීම.**

ගරු නියෝජ්‍ය නගරාධිපති තුමාගේ සහ ගරු නාගරික මන්ත්‍රී නදීර ප්‍රභාත් ධර්මදාස මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයන් ඉදිරිපත් විය.

**5.3 2018/07/09 වන දින පැවති නිවාස ක්‍රීඩා, සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ වාර්තාව සම්මත කර ගැනීම.**

ගරු නාගරික මන්ත්‍රී දුමිඳු දයාසෙන් රැටියල මැතිතුමාගේ සහ ගරු නාගරික මන්ත්‍රී සුරංගි ආර්. සමරතුංග මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයන් ඉදිරිපත් විය.

ගරු නාගරික මන්ත්‍රී රශ්මික ගමආරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අදහසකට අනුව කුම්බිච්චන්කුලම උද්‍යානයේ විනෝද අංග වශයෙන් ඉලෙක්ට්‍රික් කාර් මුදල් අය කර ක්‍රීඩා කිරීම ලබා දෙන බවත්, එකී මුදල සාධාරන නොවන බවටත්, කරුණු ඉදිරිපත් වු බැවින්, එකී කාර්යය නවතා දැමීමට කටයුතු කිරීම පිළිබඳ සුදුසු බවට යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව අදාල යෝජනාව ඉදිරි මුදල් ස්ථාවර කමිටුව වෙත යොමු කර තීරණයක් ගැනීම සුදුසු බවට ගරු නගරාධිපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**5.4 2018/07/10 වන දින පැවති නව ආයෝජන, ආදායම් උත්පාදන, ඉඩම් හා දේපල නිරවුල් කිරීමේ කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ වාර්තාව සභා සම්මත කර ගැනීම.**

ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමාගේ සහ ගරු නාගරික මන්ත්‍රී විනෝදනි විජේසූරිය මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයන් ඉදිරිපත් විය.

ගරු නාගරික මන්ත්‍රී ඉන්දික අරුණ කුමාර මැතිතුමා විසින් අදහස් ප්‍රකාශ කරමින් මෙම කමිටුවේ දී විෂයට අදාල කරුණු පිළිබඳ සාකච්ඡා වන බවක් නොපෙනන අතර, සභාවේ දේපල නිරවුල් කිරීම හා පොදු දේපල හැර පෞද්ගලික ඉඩම් පිළිබඳ විශාල වශයෙන් සාකච්චා වී ඇති බවට ප්‍රකාශ කරන ලදී.

**5.5 2018.07/10 දින පැවති පරිසර, කෘෂිකර්ම හා රථවාහන කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ වාර්තාව සම්මත කර ගැනීම.**

ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත් මැතිතුමාගේ සහ එම්.පී.එම්. අන්සාර් මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයන් ඉදිරිපත් විය.

**5.6 2018.07.12 දින පැවති යටිතල පහසුකම්. පුස්තකාල, තොරතුරු තාක්ෂණ හා පුහුණු කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ වාර්තාව සම්මත කර ගැනීම.**

ගරු නාගරික මන්ත්‍රී නලීන් සිරිවර්ධන මැතිතුමාගේ සහ එම්.පී.එම්. අන්සාර් මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ඉදිරිපත් විය.

**5.7 2018/07/12 දින පැවති සමාජ සවිබල ගැන්වීම හා ජීවනෝපාය සංවර්ධන කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ වාර්තාව සම්මත කර ගැනීම.**

ගරු නාගරික මන්ත්‍රී දුමිඳු දයාසෙන් රැටියල මැතිතුමාගේ සහ ගරු නාගරික මන්ත්‍රී සුපිනි සඳමාලි මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයන් ඉදිරිපත් විය.

**5.8 2018.07/16 වන දින පැවති කාන්තා කටයුතු , පූර්ව ළමාවිය, ළමා හා මාතෘ සායන පිළිබඳ ස්ථාවර කමිටුවේ වාර්තාව සම්මත කර ගැනීම.**

ගරු නාගරික මන්ත්‍රී සුපිනි සඳමාලි මැතිතුමියගේ සහ ගරු නාගරික මන්ත්‍රී සුරංගි ආර්. සමරතුංග මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයන් ඉදිරිපත් විය.

ස්ථිවර කමිටු සම්මත කර ගැනීම සඳහා ඡන්දය විමසීම.

| | | | |
|---|---|---|---|
| 01. | එච්.පී. සෝමදාස මැතිතුමා | - | පක්ෂව |
| 02. | එම්.ඩබ්. බුද්ධික ප්‍රේමදාස මැතිතුමා | - | පක්ෂව |
| 03. | ආනන්ද දහනායක මැතිතුමා | - | පක්ෂව |
| 04. | ආර්.ඩී.කේ. සුසිල් තිලකරත්න මැතිතුමා | - | පක්ෂව |
| 05. | ඒ.එම්.පී. අන්සාර් මැතිතුමා | - | පක්ෂව |
| 06. | නලීන් සංජීව සිරිවර්ධන මැතිතුමා | - | පක්ෂව |
| 07. | දුමිඳු දයාසෙන් රැටියල මැතිතුමා | - | පක්ෂව |
| 08. | එල්.ජී. ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | - | පක්ෂව |
| 09. | ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී. වීමුක්ති රණවීර මැතිතුමා | - | පක්ෂව |
| 10. | සුපුනි සඳමාලී මැතිනිය | - | පක්ෂව |
| 11. | නදීර ප්‍රභාත් ධර්මදාස මැතිතුමා | - | පක්ෂව |
| 12. | එස්.ආර්.ඒ. සුරංගි රේණුකා සමරතුංග මැතිනිය | - | පක්ෂව |
| 13. | එම්.ඩී.කේ. විනෝදනි විජේසූරිය මැතිනිය | - | පක්ෂව |
| 14. | කේ.පී. සචිනි නිමේෂා මැතිනිය | - | පක්ෂව |
| 15. | කේ.එච්. ඉන්දික අරුණ කුමාර මැතිතුමා | - | නිහඬයි |
| 16. | නීතීඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා | - | නිහඬයි |
| 17. | සමන් ප්‍රියන්ත ජයවර්ධන මැතිතුමා | - | නිහඬයි |
| 18. | රශ්මික ගමආරච්චි මැතිතුමා | - | නිහඬයි |
| 19. | ඩී. ජී. පේමදාස මැතිතුමා | - | නිහඬයි |
| 20. | ජී.ඒ. ශිවන්ත මලික් කුමාර මැතිතුමා | - | සභාවට සහභාගී වීම ප.ව. 12.05 වන බැවින් ඡන්දය විමසන අවස්ථාවේ දී සභාවේ නොසිටින ලදී. |
| 21. | රෝෂාන් ඉස්මත් බුහාරි මැතිතුමා | - | නිහඬයි |
| 22. | ආර්.ඒ. විමල් රවින්ද්‍ර රණසිංහ මැතිතුමා | - | නිහඬයි |
| 23. | නීතීඥ කේ.එස්.ටී. නිර්මලි ප්‍රියදර්ශනි මැතිතුමිය | - | නිහඬයි |

| | | | |
|---|---|---|---|
| 24. | කේ.ඒ. ඉන්ද්‍රානි මැතිතුමිය | - | නිහඬයි |
| 25. | ඩබ්.ජී.සී.කේ. ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා | - | නිහඬයි |
| 26. | කේ.පී. අසේල ඉන්දික විජේසිංහ මැතිතුමා | - | නිහඬයි |
| 27. | එච්.බී. සීතා හේරත් මැතිනිය | - | නිහඬයි |
| 28. | එම්.එස්.එම්. අල් ෆාරීස් මැතිතුමා | - | ඡන්දය විමසන අවස්ථාවේ දී සභාවේ නොසිටින ලදී. |

- පක්ෂව ඡන්දය ලබා දීම - 14
- විරුද්ධත්වය සහ පක්ෂව හා ඡන්දය ලබා දීමෙන් වැලකි සිටීම - 12
- සභා ගර්භයේ නොසිටීම - 02
- නොපැමිණීම - 01

ඒ අනුව වැඩි ඡන්ද 14 න් ස්ථාවර කමිටු වාර්තා සභා සම්ත විය.

## *06. මන්ත්‍රීවරුන්ගේ ඉදිරිපත්කිරීම්.*

**ගරු නාගරික මන්ත්‍රීන් සමන් ප්‍රියන්ත ජයවර්ධන මැතිතුමා**.

ගරු නගරාධිපතිතුමනි, 2018 පුරවර උදානය ආදායම් වියදම් වාර්තාවක් මටනම් ලැබුණේ නැහැ මං දන්නේ නෑ අනිත් අයට ලැබුණ ද කියලා. ඒක මම ඉල්ලා සිටිනවා.

**ගරු නගරාධිපතිතුමා**

ඒක ඉදිරි සභාවට ලබා දෙනවා

.

**ගරු නාගරික මන්ත්‍රී ඉන්දික අරුණ කුමාර මැතිතුමා.**

ගරු නගරාධිපතිතුමනි, මහජන පොළේ ඉදිකර ඇති මාළු කඩ කඩා ඉවත් කිරීම සම්බන්ධයෙන් මහජනතාව අතර ආන්දෝලනාත්මක තත්වයක් ඇති වෙලා තියෙනවා. අනුරාධපුර මහ නගර සභාවේ අනුමැතිය යටතේ රජයේ මුදල් ලක්ෂ එකසිය හතළිස් අටක් වැය කරලා මේ කඩ ඉදි කරලා තියනවා. ඒ කඩ ඉදිකිරීම සඳහා පැවති මහ නගර සභාව, සභාවක් වශයෙන් අනුමැතිය ලබාගෙන තියෙනවා. ඒ ලබා ගෙන තිබියදී වර්තමානයේ දී එය කඩා ඉවත්කිරීම කරලා තියනවා . මේ සම්බන්ධව වගකීමක් ගන්නේ කවුද ? ඒ සම්බන්ධව හා මේ මුදල් වැයවීම සම්බන්ධවත්, ඒ වැය කළ මුදල් කඩ ඉදිකරන්නත් පෙර , ආරම්භ කරන්නත් පෙර කඩා දැමීම තුළ විශාල අගතියක් වෙලා තියෙනවා කියලා ජේනවා. ඒ වගේම ජනතාවගේ ලොකු විරෝධයක් තියෙනවා මේ සම්බන්ධව. නගරාධිපතිවරයා වශයෙන් ඔබතුමාගේ අදහස මොකක්ද කියලා දැනගන්න කැමතියි.

**ගරු නගරාධිපතිතුමා**

මේ භූමිය නගර සභාව සතු භූමියක්. මේක සැලසුම U D එකෙන් තමයි හදලා තියෙන්නේ පහුගිය වර්ෂවල. අපේ හිටපු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා U D එක භාරව ඉන්න කාලෙදි තමයි මේ සැලැස්ම හදලා තිබුනෙ. ඒ අතරතුරේ අපේ පළාතේ සංවිධායකවරුන්ට විවිධ වැඩසටහන් වලට සල්ලි දුන්නා . අපේ නැගෙනහිර ආසන සංවිධායක තුමා මේ මාළු කඩ හදන්න කියලා ඒ මුදල් ලබා දුන්නා. එතකොට මේක ඉදිකිරීම් කරන අවස්ථාවේදී තමයි නගර සභා විසුරුවාහැරලා අපි ගෙදර ගියේ. මේ මාලු කඩ සැලසුමට පරිබාහිරව U D එක තමයි ඉදිකිරීම් කරලා තියෙන්නේ. එතකොට මේ කඩ වල ඉන්නත් බෑ හුලං වදින්නෙත්

නෑනේ මේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී මේවා සංශෝධනය කරන්න සිද්ධ වුණා ඒ අනුව මාළු කඩයකට සුදුසු විදිහකට අපි හදන්න කියලා අපි සැලසුම දුන්නා. අපි ඒ සැලැස්ම දීලා තියෙන්නේ කොට බිත්ති නමුත් හදල තියෙන්නෙ උස බිත්ති. ඒ කාලසීමාවේ හිටියේ අපි.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඉන්දික ඉන්දික අරුණ කුමාර මැතිතුමා.</u>**

ඔවු දැන් ගරු නගරාධිපතිතුමා මේක ලක්ෂ 148 ක මුදලක් නේ. කවුද මේකේ වගකීම ගන්නේ.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

දැන් මේකේ සියලු අධීක්ෂණ කටයුතු කච්චේරිය තමයි කරන්නේ. මම මේකේ තොරතුරු ගෙනල්ලා ඔබතුමාට පෙන්නන්නම් අවශ්‍ය නම් ඊළඟ සභාවාරයට. මේක සම්පූර්ණයෙන්ම අපේ වගකීම තියෙන්නේ කොටසක් අධීක්ෂණය කරන්න.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඉන්දික අරුණ කුමාර මැතිතුමා</u>**

දැන් එහෙම වෙලා මේක කඩලා දාපුවහම කවුල මේකට වග කියන්නේ. රජයේ මුදල් අවභාවිතා වීම සම්බන්ධව. දැන් පසුගිය පාලන කාලයේදී අනුමත කරපු සැලැස්මක් තියෙනවා නේ. මේ සැලැස්මට අනුකූලව එහෙම වෙලා තෙමේ මුදල් පිළිබඳ කවුද මේ වගකීම ගන්නේ රජයේ මුදල් අවභාවිතයක් මෙතන සිදු වෙනවා

**<u>ගරු නගරාධිපතිතුමා .</u>**

දැන් මේකෙ ප්‍රධාන සැලැස්මක් තියෙනවා ඒ සැලැස්ම ඇතුලට තව සැලැස්මක් දාලා තියෙනවා එහෙම කරන්න බැහැනෙ .එක්කෝ හදන එක නවත්තන්න ඕනේ.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඉන්දික අරුණ කුමාර මැතිතුමා.</u>**

දැන් මේක සැලැස්මක් ඇතුලෙ සැලැස්මක් අනුමත අනුමත කරලා ඒ සැළැස්මට පරිබාහිරව ඉදි වුණා කියලා දැන් කඩා දැමීම තුළ මම හිතන්නේ රජයේ මුදල් එක්කෝටි හතලිස් අට ලක්ෂයක් අවභාවිතා වීම සම්බන්ධව අපි කණගාටුව ප්‍රකාශ කර සිටිනවා. විශේෂයෙන්ම මෙවැනි තත්ත්වයන් ඇති වීම තුල, එවකට පැවැති පාලන සමයේ මුදල් හෝ ඒවා රජයෙන් මුදල් . එය ලබා දුන්නට එය අව භාවිත වීම සම්බන්ධයෙන් අපගේ දැඩි විරෝධය ප්‍රකාශ කර සිටිනවා. කෙසේ වුවත් මේ විදියට රජයේ මුදල් නාස්ති කිරීම ඇත්තටම කනගාටුවට කරුනක්. ඒ සම්බන්ධව බරපතළ විරෝධය ප්‍රකාශ කරනවා. විශේෂයෙන්ම අනුරාධපුර මහ නගර සභාව විදිහට මේ සම්බන්ධයෙන් හැමෝම එකඟ ඇති මෙවැනි ආකාරයේ රජයේ මුදල් වියදම් කරලා එය කඩා බිඳ දානවා නම්, පාවිච්චියට නොගෙන වියදම් කරනවා නම් ඒ බලවත් විරෝධය ප්‍රකාශ කර සිටිනවා.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

මෙතන මාළු කඩ 32 ක් තියනවා. මාළු කඩයක් කියන්නේ හුලං වදින්න තියෙන්න ඕනේ විවෘත වෙන්ඩ ඕනේ මේ සැලැස්මට පරිබාහිරව තමයි මේක ඉදිකිරීම් කරලා තියෙන්නේ අපි මාලු කඩ හදන්න කියලා අනුමැතිය දීලා තියෙනවා හැබැයි අනුමත විදිහට නෙමේ කරලා තියෙන්නේ.

**<u>ගරු නාගරික මන්ත්‍රී නීතිඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා.</u>**

මේක ඔය ආරවුල් ගොඩක් අස්සේ වැඩක් ඕය. මම එදා පැහැදිලිව ම විරුද්ධ වුණේ බැසිල් රාජපක්ෂ මැතිතුමා ඔය කටයුත්ත කරන්න ගියපු හින්දා . අයියා ඕක කරා මල්ලි UD 1 කරා. අයියයි මල්ලියි කරපු මගුලෙන් අපේ රටේ සල්ලි තමයි නැති වුණේ.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

අපට එහෙම කියන්නත් බෑ ඒ මුදල් දෙන්නේ ගං වල වැඩ කරන්න කියලා එක්කෙනාගෙ මුහුණු ගහන්න ඕන කමට නගර සභාවට ගෙනාවා නගර සභාවට එකයි දැන් ආයුර්වේද ලක්ෂ කීයක් වියදම් කරල ද හදන්නේ ප්ලෑන් එක අනුමත කරල නෑ හදනව කවුද වගකියන්නේ සැලසුම් අනුමත කරල නැහැ . ඒ වුණාට දැන් සල්ලි වියදම් කරනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී නීතිඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා.</u>**

ඕක හින්ද තමයි මම එදත් විරුද්ධ වුණේ අපේ නගර සභාවේ අපේ වැඩ අපේ මන්ත්‍රීවරුන්ට පිටින් අර ඊ.ටියල මන්ත්‍රීතුමාට මොනවත් දුන්නේ නෑ. ඔතනදී අපිට නෑ කියන්න බෑ අපි ඉන්න කාලේ හැදුවේ. අපි ඉන්න කාලේ හදලා ඔබතුමාලා මාළු ලෑලි තිබුණ ඒවා අයින් කරලා වෙන මිනිස්සුන්ටත් ඔය කඩ දුන්නා. ඔය සැලැස්මේ ඔය කඩ ටික තිබුනා. ඉතිරි ටිකට foundation දාලා තිබුණා. පස්සේ එක එක්කෙනා අකමැතියි කියලා කිව්වට මුලදී කැමැත්ත තිබුණා. නමුත් වැඩේ තියෙන්නේ මොනවා උනත් රජයේ දේපළ පිළිබඳ ප්‍රශ්නයක්ද ඔතන තියෙනවා. ඒ කියන්නේ කවුරු මොනා කරත් එදා මට මතකයි අපේ සැලසුම් කමිටුවේදී ඇහුවා. එහෙම වුණා නම් අපි එවෙලෙම විරුද්ධ වෙන්න තිබුනනේ. මට මතකයි අපි ඉන්නකොට අපේ ඉංජිනේරුට යන්න කිව්වා ඕක බලන්න කියලා ඉතින් ඕක ගැන පොඩ්ඩක් සැලකිලිමත් වෙන්න වෙයි. නැත්නම් අපිට කැරකිලා එයි.

ඊළඟ කාරණය තමයි මට හරි කනගාටුයි එක්කෙනා කේලම් කියලා තමයි අපට ජනවාරි 8 වැනිදා නැතිවුනේ . තවත් බොරු කියනවා නේ , ඊයේ ප්‍රකාශයක් කරා මේ මල්අතු ඔය සුද්ද කරන එක ගැන. මම මතක් කරන්නම් මේ සභාවේ 2014 නොවැම්බර් 5 වැනිදා මම මේ ගරු සභාවට යෝජනාවක් ගෙනාවා මල්අතු ඔය පවිත්‍රකර මේ ගංවතුර ගැලීම් අවම කිරීමට කටයුතු කිරීම පිළිබඳව සංවර්ධනය කරන්න. දියවන්නාව ආකාරයෙන් සංවර්ධනය කර මේ මල්අතු ඔය ආශ්‍රිත සංවර්ධන ක්‍රියාවලිය ඉදිකිරීමට යෝජනා කළා. එදා අපි යෝජනා කළේ මේක සුද්ද කරලා දෙන්න කියලා එදා වැඩේ උනේ නැහැ. මේ සැරේ අලුත් ආණ්ඩුවෙන් වාරිමාර්ග අමාත්‍ය හා ජල කළමනාකරණ අමාත්‍යතුමන් දැන් අපට අපේ ප්‍රදේශයෙන් ලැබිලා ඉන්නවා. මම එතුමාට මේ කතාව කිව්වා එතුමා ගිහිල්ලා බැලුවා බලනකොට ලංකාවේ හැමතැනම මේ ලෝකෙ කොහේ ගියත් නගරයක් බිහි වෙලා තියෙන්නේ ගඟක් මුල් කර ගෙන. ඕස්ට්‍රේලියාවේ සිඩ්නි තියනවා, මෙල්බන් වල තියනවා, සවුත් අෆ්රිකා වල තියනවා. කැන්බරා තියෙනවා කොරියාව තියනවා චීනයේ තියෙනවා සිංගප්පූරුවේ තියෙනවා.

මේ ව්‍යාපෘතිය නවත්තනඩ ඇවිල්ල මේ පස් කපනවා, කුඹුක් ගස් කපනවා කියලා වැලි ගොඩ දානවා කියලා හිටපු මහ ඇමති තුමා පිස්සුවක් කෙලලා අපිව නොමග ඇරලා අර හිටපු ජනාධිපතිතුමාව නොමග ඇරලා . දැම්මේ මොකද දන්නෙ නෑ වෙලා තියෙන්නෙ. මේ එන ගංවතුර නවත්ත ගන්ඩ තියෙන වෙලාව.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

එය නවත්තන්න යන්නේ සල්ලි නැති නිසා.

**<u>ගරු නාගරික මන්ත්‍රී නීතිඥ පේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා.</u>**

නෑ නෑ මේකට සල්ලි යන්නේ නෑ නේ. යුධ හමුදාවෙන් යොදවා ගන්නේ, රජයේ වාහන. ඔබතුමා ගිහින් බලන්න දැන් ලස්සනද කොට්ඨාශ කීපයක් අහුවෙනවා. පුබුදුපුර මිනිස්සුන්ට ජයසිරිපුර මිනිස්සුන්ට නියෝජ්‍ය නගරාධිපතිතුමාගේ කොට්ඨාසය, සුසිල් මන්ත්‍රීතුමාගේ කොට්ඨාසය සුසිල් මන්ත්‍රීතුමාගේ කොට්ඨාසයෙ මේකට එකතු වෙනවා. මෙය ඔක්කොගෙම කොට්ඨාස තියෙවෝ. මටත් අහුවෙලා තියනවා. මට කොට්ඨාශයක් නෑ. මගේ උපන් පැත්ත. අම්මෝ මේක බය වෙනවනේ හිටපු ජනාධිපතිතුමා අනුරාධපුරයට ඇවිල්ලා කියද්දී බය වෙන්න රටේ හිටපු නායකයෙක් නේ මේවා කියන්නේ.

***<u>සභාවේ ඝෝෂා</u>***

දැන් මේ නිකන් සුද්ද කරන එක අර මැෂින් එක වැදිලා කුඹුක් ගහේ අත්තක් කැඩෙනකොට මහා විශාල අපරාධයක්. මොකක්ද මේකට කරන්නේ. අපේ නගරෙට මේ වටිනාකම තියෙන්නෙ. ලෝකෙට වැඩක් නෑ . අනිවාර්යෙන් මේක සුද්ද කරලා ඉවර උනහම මම යෝජනා කරලා තියෙන්නේ අර නැ.නු.ප ප්‍රාදේශීය සභාවේ ඉදල ගල්කඩවල අමුන දක්වා සුද්ද කරන්න ඕන. මේ සුද්ද කරද්දී ළඟට පටලගන තියෙන්නේ පහල මල්වතු ඔය ව්‍යාපෘතිය . පහල මල්වතු ඔය ව්‍යාපෘතිය කියන්නේ වෙන එකක් ඒක මහා ව්‍යාපාරයක් ඒක මේ අවුරුද්දෙ අන්තිම වෙනකොට ආරම්භ කරනවා. ඒක තියෙන්නේ බෝගොඩ පැත්තේ අනුරාධපුරේ නැහැ. මේක ක්ෂනික වසදුමක්. මේක කරගොත් අනිවාර්යෙන් දෙසැම්බර් මාසයේ ජල ගැනීම් වලට ලක් වෙන්නේ නෑ.

මේ අනුරාධපුරේ කේලම් කාරයෝ හින්දා තමයි මෙච්චර හරියක් වෙලා තියෙන්නේ. අන්තිමේට පැණි වරකා ගහට හෙණ ගැහුවා. විමල් වීරවංශ ලග කැල්ලයි. වාසුදේව ලග කැල්ලයි. දිනේෂ් ගුණවර්ධන ළඟ කැල්ලයි මහින්ද රාජපක්ෂ මහත්තයා ළඟ කැල්ලයි මෛත්‍රීපාල සිරිසේන මහත්තයා ළඟ කැල්ලයි චම්පික රණවක ලග කැල්ලයි. මේ දැන්වත් මේ බොරු කේලම් කාරයන්ට දැන්වත් අයින් වෙලා ඉන්න කියන්නේ පැත්තකට වෙලා ඉල්ල කියන්න. ඉස්සරහට නායකයින්ට එන්න ඕනේ නම්.

**<u>ගරු නාගරික මන්ත්‍රී නදීර ප්‍රභාත් ධර්මදාස මැතිතුමා</u>**

ගරු නගරාධිපතිතුමා, මෙතුමා හිටපු ජනාධිපතිතුමාට අපහාසාත්මක විදිහට කතා කරා ඒ පිළිබඳව මේ දැන් මේ සම්බන්ධයෙන් සිරස මාධ්‍ය යනවා විමර්ශන වලට මේකෙන් මඩ ගහනවා ඒ සම්බන්ධ මෙතුමාගෙන් අදහස් දැනගන්න කැමතියි.

**<u>ගරු නාගරික මන්ත්‍රී නීතිඥ පේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා.</u>**

මම ප්‍රකාශයක් කරන්නන්. ඔය ජනාධිපතිතුමා ඔය කවුරුවත් ප්‍රකාශක් කරන්න ගියේ නෑ. 2005 හිටියේ නෑ. 2005 ඡන්දෙදි එතුමා පරද්දන්න වැඩ කරපු එවුන් තමයි දැන් ලං වෙලා ඉන්නේ ගාමිණී ලොකුගේ කෙහෙළිය රඹුක්වැල්ල ජොන්ස්ටන් ප්‍රනාන්දු දයාසිරි ජයසේකර එස්. බී. දිසානායක, ජී එල් පීරිස් ඔය ඔක්කොම පරද්දන්න වැඩකරපු අය. මම කියන්නම් සිරසක් තියෙනවා මට . අනිත් ඒවා වැඩක් නෑ. වැඩක් නැනේ.

ඔය 2005 දී මහින්ද රාජපක්ෂ මැතිතුමාව දිනවන්න ත්‍රිකුණාමලයට යන්න කවුරුත් ඔය කියන කට්ටිය හිටියෙ නෑ. කවුරුවත් ආවෙ නෑ. ඒ රැස්වීමට යන්න අන්තිමේටම බර්ටි දිසානායක මැතිතුමාට එන්න කිව්වහම මට කිව්වා යන්න කියලා. මම ගිහිල්ලා තමයි ත්‍රිකුණාමලයේ එතුමා වෙනුවෙන් කතා කරන්න

ගියේ . මම ගිහාම ගුණවර්ධන මහත්තයා කිව්වේ මහාචාර්ය හෙට්ටිආරච්චි දැන් ආව කියලා. මොකද උන් දන්නෙ නෑනේ මම කවුද කියලා.

**<u>ගරු නාගරික මන්ත්‍රී ආනන්ද දහනායක මැතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුමනි, මම කුම්බිච්චන්කුලම වැව සම්බන්ධයෙන් කතා කරන්නේ. මේ වැවට දැන් අයිතිකාරයෝ ඉන්නවා. වැව ඉස්සරහ නේවාසික ඉන්න අය දැන් එය පුරුද්දක් වශයෙන් ඒ ඉස්සරහ ප්‍රදේශය සුද්ධ පවිත්‍ර කරලා සිමෙන්ති වට රවුම් ගහලා කුඩාරම් ගහලා තියනවා . අපි කියන්නේ අලංකරණ කටයුතු කරන්න එපා කියලා නෙවෙයි. නමුත් හදිසියකට වාහනයක් එහාට මෙහාට කරගන්න බැරි විදිහට මේ ස්ථාන මගේ කියන තැනට ඇවිල්ල තියනවා . ඒ ප්‍රදේශයේ පදිංචි අය ආක්‍රමණය කරලා තියෙනවා එහෙම වෙන්න දෙන්න බෑ. ඒක එහෙම වෙන්න ඉඩ තියන්න එපා

අනිත් එක තමයි හැමදාම කියනවා අර වැවේ පොළ පැත්තෙ කෙරවලට වෙන්න ලෑන්ඩ් මාස්ටර් එකේ තියෙන බාර් එක. දැන් එතන කොල්ලෝ කුරුට්ටෝ සෑහෙන්න වැඩිපුර ඉන්නවාත එක බොහොම කැතයි. අර කන්ටේනරය තව වදයක්. මේවා හරි අශෝභනයි,

අනිත් එක තමයි ගරු නගරාධිපති තුමනි, නිසල නිම්නය ඉදිරිපස හරිම ලස්සනයි මල් වවලා පිරිසිදුව තියාගෙන ඉන්නවා. මට ඒ ප්‍රදේශයේ මනුස්සයෙක් කිව්වා කනත්ත පිටිපස්ස හෝටලයක කුස්සියක් වගේ කියලා. මං ඇහුවා ඇයි එහෙම කියන්නේ කියලා. හෝටලයක කුස්සියක අපිරිසිදු තත්ත්වය මස් කෑලි අනම් මනං ඔක්කොම තියෙනවනේ . කුණු යන්නේ ඒ වගේ තමයි නිසල නිම්නය හොඳයිලු පිටිපස්ස වැඩක් නැහැලු. මොකද වෙන්නේ, එකක් ඒ ඉන්න සේවකයන්ගේ නොදැනුවත්කම හෝ දැනුවත් කමට වෙන්න ඇති කැලෑ සුද්ද කරලා ගිනි තිබ්බා ම එකේ අලු ඔක්කොම ඒ අවට ගෙවල් වලට යනවා. ඒවාට ගියාම කෑම පිසින භාජන වලයි ඒ සියලු තැන් වල අලුත් රැඳෙනවා. ඉතින් අන්න ඒවා පොඩ්ඩක් අපට අවම කරලා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

අනිත් එක ගරු නගරාධිපතිතුමනි, අංක 2 ප්‍රජා ශාලාවට යාබදව පිට්ටනිය එතනට බස් දානවා කියලා ඒ අවට ප්‍රදේශවාසීන් විසින් දුක්ගැනවිලි මැසිවිලි එනවා . මට මතකයි ඒ දවස්වල ඕක වටේටම ලොකු කාණුවක් කපල දාල තිබ්බා කිසිම වාහනයක් ගන්න බැරි වෙන්ඩ. නමුත් අද ඒ තත්ත්වය නැති වෙලා දැන් ලොකු බස් දාලා තියෙනවා. නමුත් ඒවා පාර්ක් කිරීමේදී හෝ බස් එහාමෙහා ගැනීමේදී අවට පරිසරයට දූවිලි එකතු වෙනවා. ඒ අවට ගෙවල් විනාශ වෙලා තියනවා. සමහරුන්ට සනීපත් නැහැ. මොකද තවත් එ්ක හරිගස්සලා දීලා ground එකක් විදිහට නෙවෙයි park කරන්නම දීලා තියෙනවා. ඉතින් මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ඉතින් මම හිතනවා ඔබතුමා ආර වල් බිහිවෙච්චි කුම්බිච්චන්කුලම වැව සංවර්ධනය කළා වගේ යම්කිසි ක්‍රමවේදයක් සකස් කරලා මේ පිළිබඳව සලකලා බලයි කියලා.

**<u>ගරු නාගරික මන්ත්‍රී රශ්මික ගමආරච්චි මැතිතුමා</u>**

ගරු නගරාධිපති තුමනි අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රී ආනන්ද දහනායක මැතිතුමා ප්‍රකාශ කරා වගේ කුම්බිච්චන්කුලම ගැන කතා කරද්දී ඒවා ඉස්සර ඒ අවට ඉඩම් නීත්‍යානුකූල කරලා රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ඉඩම් ලබා දුන්නා. ඒ වගේම ඒ කාලේ මැතිවරණයක් ජයග්‍රහණය කරපු ගමන් කට්ටිය ඇවිල්ලා මෙහෙම ඉඩම් කොටස් තමා අල්ලගන්නෙ. දිගටම වුණේ ඒක. ඔබතුමා තමයි ඒක නැති කරලා ඒ කුම්බිච්චන්කුලම ආසන්නයේ පරිශ්‍රය සංවර්ධනය කරලා ඒ සිදුවන ක්‍රියාවලිය නැවැත්තුවේ. දැන් නැවතත්

ඒ වගේම දෙයක් ටික ටික සිද්ධ වෙන්න යනවා. මේ නිසා ගරු නගරාධිපති තුමනි අර නියපොත්තෙන් කපන්න තියෙන දේ පොරවෙන් කපන්න සිද්ධ වෙන්නේ නැතුව ඒකට යම් කිසි ක්‍රමවේදයක් සකස් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී අසේල ඉන්දික මැතිතුමා.</u>**

ගරු නගරාධිපති තුමනි මුලින්ම කියන්න ඕනේ එක කාරණයක් තමයි දැනටමත් බලන්න පුලුවන් දහයියාගගම හන්දියට මෙහා පුබුදුපුර පැත්තට ගෙනල්ල දාල තියනවා කොන්ක්‍රීට් ගල් ගොඩනැගිලි සුන්බුන් මේවා විශාල ගැටලුවක් , යසසිරිපුර පාරේ ට්‍රාන්ස්ෆෝමරය ඇතුල් පාරේ ගෙනල්ලා බානවා පාරට තමයි මේක දාන්නේ. ඒ නිසා සභාවේ අවධානය යොමු කරන්න ඕනේ මොකද තැන් තැන්වල ගොඩවල් ගහලා යනවා . කොන්ක්‍රීට් කෑලි ගඩොල් මේ වගේ දේවල් දැනටමත් දකින්න පුළුවන් දහයියාගම හංදියේ පුබුදුපුර යන පැත්තේ . මේවා ඇවිල්ලා රහසේ කරන කාර්යයක් නෙවෙයි. පාරේ සම්පූර්ණයෙන්ම බාලා යනවා එතකොට අපහසුතාවයට පත් වෙනවා වාහනවල යන අය සම දෛනිකව මේ මාර්ග භාවිතා කරන අය.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

අපි මේ සම්බන්ධයෙන් කලින් දැන්වීම් පත්‍රිකාත් බෙදුවා ගෙවල්වල මේ ගොඩනැගිලි සුන්බුන් තියෙනවා නම් අපිව දැනුවත් කරන්න . ඒවා ඉවත් කරන්න කියලා. කොහොම හරි එක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ නිසා නැවතත් ඒ පිළිබඳ දැනුවත් කිරීම් කරලා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න පියවර ගන්න ඒ අදාල නිලධාරින් දැනුවත් කිරිමට පියවර ගන්නම්.

**<u>ගරු නාගරික මන්ත්‍රී අසේල ඉන්දික මැතිතුමා.</u>**

අනිත් කරුණ ගරු නගරාධිපති තුමනි රවින්ද්‍ර මන්ත්‍රිතුමා ගෙනපු යෝජනාව. ඒක මෙතන ඉවත් වුනා. එක දැන් වෙනත් කමිටුවකින් ඒයි අර අතු කපලා ඔක්කොම පාරට දානවා. ඒවා ඉවත් කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු පුද්ගලයෙක් නැහැ. ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කර යුතුයි.

ඒ එක්කම එහා පැත්තෙන් ප්‍රකාශයක් කළා , ඒකටත් යම් පිළිතුරක් දිය යුතුයි අර හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කිව්වා වගේ මහින්ද රාජපක්ෂ මැතිතුමා බලයට ගෙන්න විශාල වැඩ කොටසක් කරපු පිරිසක් තමයි අපි . එකක් බුද්ධික මන්ත්‍රිතුමා දන්නවා ගෝඨාභය මහත්තයා ඇවිල්ලා ඒ කාලේ එතුමාගේ නිවසේ රැස්වීමක් දාද්දි ජනාධිපතිවරණයේදී මගේ තාත්තා තමයි ජනතා විමුක්ති පෙරමුණ පැත්තෙන් කතාව කලේ. එතකොට අපි දැන් මෙතන සභාවේ කියනවා නං අපි නුසුදුසුයි කියලා නැත්තං ,විවේචකයෝ කියලා මම අහන්න කැමතියි ඒ කාලේ එක දැක්කේ නැද්ද. ඒ නිසා අපි එක්තරා අවස්ථාවක බුද්ධික මන්ත්‍රිතුමා කියනවා මේ යුද්ධයකට කැඳවීම සම්බන්ධයෙන් මැගහැරීම සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණ වගකියන්න ඕනේ කියලා. හැබැයි අද යුද්ධය නිමා කලේ කවුද? එය කිරීමේ ගෞරවය කාටද ලැබෙන්නේ. ඒ නිසා අපි සැබෑ විපක්ෂයේ ඉඳන් විවේචනය කළ යුතු දේවල් අපි විවේචනය කරනවා ඒක අපිට කොච්චර පාඩු වෙයිද ඒක අපිට කොච්චර බලපායිද ඒක අදාල නෑ. අපිට අපි විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියට ඔබට කියනවා අපි ඉදිරිපත් කරන දේශපාලන විවේචන ඔබලාට අදාළ නම් භාර ගන්න . දැන් මෙතන ඉන්න බොහෝ පිරිසක් දන්නවා ජාතික දේශපාලනයේ දී මීට වඩා මහින්ද රාජපක්ෂ මහත්තයට විවේචන එල්ල කරනවා රනිල් වික්‍රමසිංහ මහත්තයාට විවේචනය එල්ල කරනවා. දැන් මෙතන ඉන්න බොහෝ මන්ත්‍රීවරු අපේ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති නැත්නම් කම්කරු සංගමයේ කතා කරන වැඩ කරන

අරගල කරන ලාල් කාන්ත මහත්තයාගේ මවගේ මළ ගෙදර ජනාධිපතිතුමා පවා ආවා ඒ නිසා අපිට පෞද්ගලිකව කිසිදු විරසකභාවයක් නැහැ. අපි එල්ල කරන්නේ විවේචන අදාල නැත්නම් බාරගන්න එපා.

## ගරු නාගරික මන්ත්‍රී නලින් සිරිවර්ධන මැතිතුමා.

ගරු නගරාධිපතිතුමාගේ රටේ තුන්වෙනි බල වේගයක් තියෙන්න ඕනේ අවුරුදු 55 ක් පරණ පක්ෂයක් ජනතා විමුක්ති පෙරමුණ. හැබැයි තාම රටේ ඡන්ද ලක්ෂ 5 යි ගන්න පුළුවන් වුණේ. කොළඹ දිස්ත්‍රික්කයෙන් විපක්ෂ නායකයා ලක්ෂ හතරක් විතර ගන්නවා. චන්ද්‍රිකා බණ්ඩාරනායක ගන්නවා ලක්ෂ හතරක් විතර දිස්ත්‍රික්ක විතරක් එතකොට මේ මුළු රටේම ලක්ෂ පහක් විතර තමයි ජනතා විමුක්ති පෙරමුණ ඡන්ද අරන් තියෙන්නේ. මේකට මොකක් හරි හේතුවක් තියෙන්න ඕන. මම කියන්නේ ඔබතුමාලගේ විවේචන වලට අමතරව වැඩපිළිවෙළකුත් යෝජනා වුණා නම් මේක මීට වඩා හොඳ තැනකට ගේන්න පුළුවන්... එහෙම සභාවට විවේචන ගේන්න ඕනේ. නමුත් ඒක සාධාරණ වෙන්න ඕනේ.. ඒ වගේම ඒ විවේචනයත් එක්ක වැඩපිළිවෙළ කුත් යෝජනා වෙන්න ඕනේ විවේචනය ම කරන එක නෙමෙයි කළ යුත්තේ

දෙවැනි කාරණය අපේ ඔය පුවත්පත් දැන්වීමක් සම්බන්ධයෙන් ඔය ගැටලුකාරී තත්ත්වය යන්නේ. ඇත්තටම අපි ඒ විවේචන වලට මුහුණ දෙන්න ඕනේ නමුත් ඒ සමහර පුවත්පත් දැන්වීම් වල තියන කරුණු මම හිතන්නේ මෙතන නම් ඒ මාධ්‍යය කවුරුත් නැහැ. අපි අර දන්න ප්‍රසිද්ධ කතාවක් තියෙනවා හැසිරීම ගැන ඒ මාධ්‍ය ආයතන වැරදිත් නෑ ඒ ලියන මාධ්‍යවේදීන් වැරදිත් නෑ නමුත් ඒ අය අතරත් අපේ මේ දේශපාලනය කරන අය වගේම විවිධාකාර මත පළ කරන අය ඉන්නවා.

මම මේ උදාහරණයක් වශයෙන් කියන්නේ ඉන්දියාවේ හිටපු ජනාධිපති ඩොක්ටර් අබ්දුල් කලාම් ඊශ්‍රායලයට සංචාරයකට ගියා. එයා හිටපු හෝටලයට මිසයිල ප්‍රහාරයක් එල්ල කරා. පහුවදා පත්තරේ බලාපොරොත්තු වුණා මේ ප්‍රහාරයෙන් හානිය පිළිබඳව පුවත්පත් දැන්වීම් පළ වෙයි කියලා. නමුත් එහි තියෙන්නේ මුල් පිටුව ඊශ්‍රායලය කාන්තාර භූමියක් සරුසාර මිදි වගාවක් බවට පත් කරපු ගොවියෙක් ගැන. පත්තරේ හොයලා ඉවර වෙලා අන්තිම පිටුවේ කොටසක තමයි තිබ්බේ අර එල්ල වෙච්ච මිසයිල ප්‍රහාරය සම්බන්ධයෙන්.

ඒ මාධ්‍යවේදීන්ගේ කාර්ය භාරය පිළිබඳව අපිට ප්‍රශ්න කරන්න බැහැ . නමුත් ඒ අතරෙත් ඉන්නවා කියන එක තමයි අපිට පේන්නේ අර කුණු හොයන අය. යම් තොරතුරක් හම්බ උනහම ඒක අධ්‍යනය කළ යුතුයි විමර්ශනය කළ යුතුයි පළ කිරීමට ප්‍රථම. අපි දිගින් දිගටම දැක්කා කිසිම හේතුවෙක් නැතුව දිගින් දිගටම පළ කරපු ලිපි. ඉතිං අපි එ්කට සභාවේ කාලයක් වැය කර ගන්නේ ඒ පිළිබඳ තේරුම් නොගන්න නිසා.ඒ වෙද්දි ඒ අයගේ පැවැත්ම තීරණය වෙනවා කාලයත් එක්ක. දැන් මෙතන ඉන්න මාධ්‍යවේදියෝ ජීවිතේ හරි අඩකට වඩා මාධ්‍යයත් එක්ක හිටිය පුද්ගලයෝ.

ඊළඟ කාරණාව නගර සභාවේ තියෙන ලොකුම ගැටලුව සම්බන්ධයෙන් අවධානයක් යොමු වුණේ නැහැ ගරු නගරාධිපතිතුමා තමයි පනතෙන් ම ප්‍රධාන විධායක නිලධාරියා , ඔබතුමා තමයි ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා ඔබතුමා තමයි. ඔබතුමාම තමයි ප්‍රධාන විනය බලධාරියා. හැබැයි මේ මුදල් වංචාවට සම්පූර්ණයෙන් වග කියන්න ඕනේ ඒ අදාළ වංචාව කරපු කෙනා විතරක් නෙවෙයි සහ තව එකට සම්බන්ධ අයගේ වැඩ තහනම් වෙලා ඉන්නවා. හැබැයි අපි සභාවෙන් ප්‍රශ්න කරනවා මේකට වග කියන්නේ කවුද කියලා. මේ අක්‍රමිකතාවය වෙන්ඩ අවුරුදු දෙකක් තුනක් තිස්සේ මේ මුදල් අංශයේ ප්‍රධානීන් වග කියන්ඩ ඕනෙ.. වංචාව කරන්ඩ පසුබිමක් ඉඩක් හදලා දීපු ඒකට කවුද වගකියන්නේ. මේක අපට සභාවට එල්ලවෙන චෝදනාවක්. ගිය සැරේ අපේ එක්සත් ජාතික පක්ෂයේ නායකතුමා මේ සම්බන්ධයෙන් අවධානය යොමු

කරා. වංචාව කරපු එක්කෙනා අවුරුදු දෙකක් තුනක් තිස්සේ මේ වංචාව කරද්දි ඒ වෙච්ච දුර්වලතාවයට කවුද වග කියන්නේ. මේක වෙනස් වෙන්න ඕනේ මේ මුදල් අංශයේම දුර්වලතාවය ගැන වග කියන්න ඕනේ.

ඉතින් මේවට කවුද වග කියන්නේ මේවා හදන්න ඕනේ. අපේ සාමාන්‍ය කියමනක් තියෙනවනේ දැන් තැනකට ගලක් ගහපුහාම මොකක් හරි අනතුරක් වුණා නම් අපි බලන්නේ කොහෙන්ද ගලෙ ආවේ කියලා වැදිච්ච තැන නෙවෙයි. මුදල් අංශය අකාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් හොඳම උදාහරණය තමයි බදු වංචාව වළක්වා ගැනීමට නොහැකි වුන එක.. පත්තරේ දාලා තියෙනවා මේක හෙළිදරව් කර ගත්ත දෙයක් කියලා හෙළිදරව් උන දෙයක් හෙළිදරව් කරගන්න නම් අවුරුදු දෙක තුනක් තිස්සේ බලන් ඉන්න ඕනෙ නැනෙ ඒ නිසා මේකේ ප්‍රරස්පරතාවයක් තියෙනවා පරිපාලනය. ඒවට තාම අත තියලා නෑ.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

ගරු මන්ත්‍රීතුමා එහෙනම් අපේ ඉස්සරලම ඉවත් කරන්න ඕනෙ නගරසභාවේ තියෙන audit එක. අපි සල්ලිත් ගෙවනවා මම එක සැරයක් ඔය මුදල් වංචාව බදු වංචාව වෙච්ච වෙලාවේ ඔඩිට් එකට සල්ලි ගෙව්වේ නෑ. පස්සේ මට බලපෑමක් කළා මේක ගෙව්වේ නැත්නම් ප්‍රශ්නයක් වෙනවා කියලා. පස්සේ තමයි අපි ඒක ගෙවන්න තීරණය කරේ. ඒගොල්ලන්ට වත් මේවා අහුවුණේ නෑ.. ඇත්තටම දැන් අපි නගර සභාව පරිපාලනය තිබුණට අපි චෙක් එකක් අත්සන් කරන්නෙත් නෑ වවුචරයක් අත්සන් කරන්නෙත් නෑ. මේවා දැන් අපෙන් අයින් කරලානෙ තියෙන්නෙ . එකනේ ප්‍රශ්නේ. දැන් ඉස්සර අපි චෙක්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් දැනුවත් වෙනවා. මේ අහවලාට මෙච්චර ප්‍රමාණය චෙක්පත් නිකුත් වෙනවා කියලා. ඔක්කොම බලලා දුන්නේ. දැන් මේ බලය ඉවත් කරලා තියෙන්නේ සියලුම සභාපතිවරුන්ගේ.

**<u>ගරු නාගරික මන්ත්‍රී නලින් සිරිවර්ධන මැතිතුමා.</u>**

දැන් අපිට සභාවක් වශයෙන් විගණන අංශය පිළිබඳ තීරණයක් ගන්න බැහැ.. නමුත් අපට මේ වංචාව සම්බන්ධයෙන් පියවරක් ගන්න පුළුවන් . නගරයේ වැසියන් අපෙන් ප්‍රශ්න කළා. ඇයි මේ සම්බන්ධයෙන් තාම පියවරක් ගත්තෙ නැත්තෙ කියලා. ඔබතුමාලා අපි මේ සභාවට ඇවිල්ලා තාම මාස දෙකයි තුනයි. අවුරුදු දෙකක් තුනක් තිස්සේ සභාව නිකන් දුවලා තියෙනවා . ඒ කාලෙත් මේ වංචා වෙලා තියෙනවා අදටත් අපි ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් අරන් නැහැ.. මේ සංඛ්‍යාලේඛන මම කිව්වෙත් නැත්තෙ මේක හරි භයානක තත්ත්වයක්. මේ සිදුවෙච්ච වංචාවට කවුද වගකියන්නේ.

අපට මේ නගර සභාවේ සල්ලි නැතුව කිසිම සංවර්ධනයක් කරන්න හම්බවෙන්නෙ නෑ. දැන් මේ සල්ලි ටික හොරකම් කරලා තියෙනවා. සල්ලි එන මාර්ගය වැළකිලා තියෙනවා. අකාර්යක්ෂමතාව නිසා. එන මාර්ගයත් වැළකිලා ආපු ඒවත් හොරකම් කරලා. ඒ ගැන පියවරක් ගැනීම ඉතාම කඩිනමින් කළ යුතුයි.

ඒවගේම අපි දැක්කා තාම මේ හා සම්බන්ධව දුර්වලතා හැමතැනම තියෙනවා. සැපයුම් රාජකාරි වල දුර්වලතා තියනවා ඒවා නියමිත පරිදි කෙරෙන්නෙ නෑ. නගරාධිපතිතුමා ඇවිල්ලා ඉතාමත් හොඳ සංවර්ධන යෝජනාව ගැන අදහස් ඉදිරිපත් කරලා තියෙනවා අද වෙනතුරු ඒ සම්බන්ධව ඉදිරි කටයුතු කරල තියෙනවද? ගිය අවුරුදුවල අපි කොච්චර සංවර්ධන යෝජනා කරලා තියෙනවද? කොච්චර කාර්යක්ෂමව කටයුතු කරල තියෙනවද? නිකන් නෙමේ කෝටි ගණන් වලින් අපි වියදම් කරලා තියෙන්නේ සංවර්ධන යෝජනා වලට.. හැබැයි දැන් තත්ත්වය වෙනස් අපි උත්සාහ දරන තැන් වලට අපේ ඉලක්ක වලට මේ සභාව ගෙනියන්න බැරි තත්වයක් ඇවිල්ල තියෙනවා මාස තුනක් හතරක් වෙනවා සභාවට ඇවිල්ලා පුවත්පත්වල දැන්වීමක් දාගන්න බැරිවෙලා තියෙනවා.

ඒ වගේම අපි යෝජනා කරන සංවර්ධන යෝජනා වලට අනවශ්‍ය නීති රීති ගෙන තියෙනවා. පොසොන් කඩ දෙන්න යද්දී හැඳුනුම්පත් ඉල්ලනවා මේ මන්ත්‍රීවරු ප්‍රායෝගිකව මුහුණ දේවල්.

**ගරු නගරාධිපතිතුමා.**

දැන් මෙතනදි audit එක මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න කලින් ප්‍රශ්න පත්තරයක් ඇහුවා කඩේ දිග පළල ඇහුවා දෙන කෙනා ඇහුවා ඉතින් මේවට උත්තර දෙන්න වෙනවා.

**ගරු නාගරික මන්ත්‍රී නලින් සිරිවර්ධන මැතිතුමා.**

මම හිතන්නේ දැන්වත් අපි මේ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ගයකට අවතීර්ණ විය යුතුයි. මේක අපි මේ පරීක්ෂණය සම්බන්ධයෙන් බොහොම විනිවිදභාවයෙන් සභාවේ පාලනය හසුරුවනවා කියන එක නගරයේ සහ ලංකාවේ ම බරපතළ ප්‍රශ්නයක් විදියට පේන දෙයක් පළාත් පාලන ආයතනයක සිදු වෙච්ච විශාල මූල්‍ය වංචාවක් එනිසා අපේ විනිවිදභාවය පෙන්විය යුතුයි. ඒ නිසා ඉතාමත් කඩිනමින්, සැකිල්ල වෙනස් කළ යුතුයි. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේකට ඉතාමත් කඩිනමින් පියවරක් ගන්න ඕනේ නැත්තම් මේ එල්ලවන සැකය එල්ල වන චෝදනාව ප්‍රධාන ගණන් දීමේ නිලධාරි හැටියට ඔබතුමාට තමයි ඒ ආශ්‍රයෙන් මුළු සභාවටත් බලපානවා. එනිසා ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කියලා කාරුණිකව ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපි දැක්කා පසුගිය කාලසීමාවේ ඔබතුමා මේ වගේ දේවල් වුනහම බොහොම දැඩි තීරණවලට පියවරට ගමන් කළා. නමුත් මේ මාස හතර පහ එක දෙයක් පිළිබඳ හතර පස් සැරයක් හිතන ස්වරූපයක් තමයි තියෙන්නෙ. වැඩිපුර හිත හිත ඉන්නේ නැතුව කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා ස්තූතියි.

**ගරු නාගරික මන්ත්‍රී සමන් ප්‍රියන්ත ජයවර්ධන මැතිතුමා**

ගරු නගරාධිපති තුමනි තිසාවැව සුසාන භූමිය සම්බන්ධයෙන් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න ඕනේ. ගේට්ටුව ගැලවිලා පිටු පස්සේ වැටක් නැහැ. එහි වැඩකරපු සේවකයා විශ්‍රාම ගිහිල්ලා එතැනට තාම මුරට කෙනෙක් නැහැ. මේ වන කොට සුසානභූමිය විවිධ අපචාරවලට යොදා ගන්න තැනක් වෙලා තියෙනවා. මත් ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයා නිතර ගැවසෙනවා.. එනිසා නිලස නිම්නය සුසාන භූමියට සිවිල් ආරක්ෂක බලකායෙන් දාල තියෙන අය වගේ මේ සුසාන භූමියට සිවිල් ආරක්ෂක බලකායෙන් කෙනෙක් හරි කීප දෙනෙක් හරි ආරක්ෂාවට යොදනවා නම් හොඳයි කියලා මම ඉල්ලීමක් කර සිටිනවා.

**ගරු නගරාධිපතිතුමා.**

ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා ඔබතුමාට එක කරන්න පුළුවන්. මම වාරිමාර්ග එකේ අධ්‍යක්ෂක තුමාටත් කිව්වා අපි මේ වැවේ නාන එක ගැන දැක්කා පහුගිය කාලය තුල සිය ගණනක් නානවා. බස් පිටින් ඇවිල්ලා නානවා මේක. මේ ජලය බීමට පාවිච්චි කරනවා. මෙතන පොඩි ප්‍රශ්නයක් තියෙනවා. වාරිමාර්ගය කිව්ව ඇස්තමේන්තුවක් හදන්න කියලා. වැට ගහන්න ඔබතුමා ඒ ගැන පොඩ්ඩක් මේ ගැන අවධානය යොමු කරලා කටයුතු කරන්න කියලා. මම ඉල්ලීමක් කරනවා. බෝවිස්ටා හොටෙල් එක ළඟ ඉඳලා ඒකනායක මහතාගේ ගෙවල් ලඟට වෙනකල් මේ වැව වටේට වැටක් ගහන්න.

**<u>ගරු නාගරික මන්ත්‍රී නදීර ප්‍රභාත් ධර්මදාස මැතිතුමා.</u>**

මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව සම්බන්ධයෙන් මේ පාරත් සෞඛ්‍ය ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවට ගෙනත් තියෙනවා. මේක ඒ වාර්තාවේ සඳහන් වෙලා තියෙනවා. තිසා වැව සුසාන භූමිය සම්බන්ධයෙන් ගේට්ටුවක් ඉදිකිරීම වැටක් ඉදිකිරීම මුරකරුවෙකු යෙදීම ශාලාව අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් කටයුතු කඩිනමින් ඉටු කරන්න අවශ්‍ය පියවර ගන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමා</u>**

ගරු නගරාධිපතිතුමා, මහා සභාවට දැන් අවම වශයෙන් යෝජනා දෙකක් වත් ඉදිරිපත් වෙනවා එතකොට මේ යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මහා සභා, ව මුදල් කාරක සභාව හැරුණු කොට ගෙන තවත් ස්ථාවර කමිටුව හතක් තියෙනවා. මේ හතෙන්ම ඔබතුමාගෙන් දැඩි අවධානය යොමු කරන්න කැමතියි. මේ අදහස් ඉදිරිපත් කිරීමේ දී සභාපතිවරුන් වැඩ කරන්නේ නෑ කියලා ඔබතුමා මීට පෙර අපිත් එක්ක සාකච්ඡා කරලා තියෙනවා. මේ කමිටු වල සභා සභාපති වරු වෙනස් කරන්න ඕනේ වැඩ යන්නේ නෑ කියලා. ඒ වගේම මම මේ අවස්ථාවේදී අවධානය යොමු කරන්න කැමතියි. මේ කමිටු සඳහා සහභාගි වන නිලධාරි සම්බන්ධයෙනුත් ඒ ගැනත් හොයලා බලලා ඒකෙන් එන යෝජනා ක්‍රියාත්මක නොවන ක්‍රමවේදය මොකක්ද මොන විදිහකින් හරි අපි දන්නවා ක්‍රියාත්මක කිරීමට අපහසු තාවයක් තියෙනවා. ඒ හැරුණු කොට ගෙන කරන්න පුළුවන් දේවලුත් මගහැරිලා තියෙනවා. ඒ නිසා ඒ ගැන වැඩි අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මේ කමිටු හතේම කරන යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තමයි මම කතා කරන්නේ . ඒ වගේම වැව් පහක් සඳහා මීට පෙර මම යෝජනාවක් ගෙනාවා සභාවට පවර ගන්න කියලා. එකක් හරි මම බලාපොරොත්තු වෙනවා එක වැවක් හරි නගර සභාවට පවරා ගන්න ඒ අදාළ කටයුතු කරයි කියලා. බොහොම ස්තුතියි.

**<u>ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපේ සමන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රකාශය ඒ සම්බන්ධයෙන් සෞඛ්‍ය ආගමික කටයුතු කමිටුවේදී සාකච්ඡා කරා ඒ සම්බන්ධයෙන් කමිටුවේ දී වාර්තා වුණා . ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරන්නත් අපේ නිලධාරීන්ට වගකීම පැවරුවා. මොනවා හරි හේතුවක් නිසා පරක්කු වෙනවද මම දන්නේ නෑ. ඒ වගේම අපේ කමිටුවෙන් කතා කරන ඩෙංගු වැඩසටහනක් මාසෙට දෙපාරක් හරි ක්‍රියාත්මක කරමු කියලා. ගිය සතියට කලින් සතියේ මම මෙතුමාගේ කොට්ඨශයේ කරන්න යෝජනා කරා. දැන් එක දිගට උත්සව ගණනාවක් ආපු නිසා ඒ දේවල් කරගන්න බැරි වුණා. අනිත් එක අසේල මන්ත්‍රීතුමා කිව්වා වගේ මම දැක්කා යසසිරිපුර පැත්තේ ගෙවල් කඩලා ඒ සුන්බුන් පාරට දාලා තියෙනවා. කලින් දැනුවත් කරා ඔබතුමා කිව්වා වගේ ඒ සෞඛ්‍ය මධ්‍යස්ථාන මඟින් ඒ ජනතාවට ඒ සුන්බුන් අපට කිව්වා නම් අපි මුදලක් අය නොකර ඒවා ඉවත් කරනවා.

විශේෂයෙන්ම අපි බලන්න ඕනේ නගරයේ හෝටල් සම්බන්ධයෙන්. ඔබ තුමා කිව්වා වගේ මම හිතන්නේ අපට සෞඛ්‍ය නිලධාරීන් එවලා තියෙන්නේ අපිට අඩුයි. සමහර හෝටල් වල උයන ස්ථාන ගන්න දෙයක් නෑ පෙර වගේ වර්ගීකරණය කරලා කටයුතු කරන කාලේ හොඳට තිබ්බා දැන් ඒක ආපහු කරන්න ඕනෑ කියලා මම කියනවා. අඩුපාඩු තියෙනවා ඒ අතවශ්‍ය වැඩ ටික කරන්න බලලා ඉවර වෙලා කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරමින් කතාව අවසන් කරනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඉන්දික අරුණ කුමාර මැතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුතමනි, මම ඔබතුමාට අදහසක් වශයෙන් ඉදිරිපත් කරන්න කැමතියි. මේ නගර සභාවේ එක් එක් අංශවල ප්‍රධානීන් ඉන්නවා ඒ අංශ ප්‍රධානීන්ට වගකීම තිබුණට ඒ වගකීම් බෙදිලා නෑ. මම හිතනවා එවැනි දේ කදී භාණ්ඩ මිලදී ගැනීමක් වගේ වෙද්දී ඒවා එන්නේ එක තැනකට එතකොට එක අංශයක් හරහා යන්න ගියාම ලොකු කාලයක් යනවා.

## ගරු නගරාධිපතිතුමා

මෙහෙමයි ගරු මන්ත්‍රීතුමා, පසුගිය මාස 20 ක කාලයක් නිලධාරි නිලධාරි විතරයිනේ මේකෙ වැඩ කරේ දැන් මේක අපි සභාවට ඇවිල්ල මාස හතරයි නේ. දැන් මේකේ තව මාස දෙකක් විතර යයි මේකෙ සභාවක් දුවනවා කියලා දැනගන්න දැනෙන්න.

## ගරු නාගරික මන්ත්‍රී ඉන්දික අරුණ කුමාර මැතිතුමා

ගරු නගරාධිපතිතුමාගේ මම තව කාරණයක් කියන්න කැමතියි. මේ නගරයේ දිවා කාලයේ කාලයේ තැනින් තැන ආහාරය කෙටි ආහාර නැත්තං දිවා ආහාර ජංගම කුටි වශයෙන් තියන ස්ථාන තියෙනවා මේ. වගේ සෞඛ්‍යාරක්ෂිත තත්ත්වය පිළිබඳ නිසි ඇගයීමක් කොහොමද වෙන්නේ කියන එක නිසි අධීක්ෂණයක් වෙනවද කියන එක ප්‍රශ්නයක්.

මොකද නගරයට එන ජනතාවගෙන් කාර්යබහුලතාවය නිසා ඒ අය හුරුවෙලා තියෙනවා. මේ ආහාරපාන මිලදී ගන්න. එතකොට පිරිසිදුභාවය සහ සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳව විශාල සැකයක් තියෙනවා. ඒවා තියාගෙන ඉන්න ආකාරය හා තියෙන ස්ථාන ඒ නිසා ගරු නගරාධිපතිතුමා අපේ සෞඛ්‍ය අංශ එක්ක සාකච්ඡා කරලා ඔවුන්ට උපදෙස් දෙන්න අපේ සෞඛ්‍ය අංශයේ සේවය පළාත් සෞඛ්‍ය සේවයේ හරි නිලධාරීන්ගේ සහයෝගය ලබා ගෙන විධිමත් වැඩසටහනක් මේ නගරයේ ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වගේම උදාහරණයක් ගත්තොත් කානු පද්ධතිය ගත්තත් නගරයේ ප්‍රධාන ආපන ශාලාවක් කසල බැහැර කරන ක්‍රියා පිළිවෙළ අනුව ඒ ස්ථානවල සැහෙන දුර්ගන්ධයක් ඇති වෙනවා. ඒ ආයතනයට අගතියක් වන නිසා මම ඒ නම සඳහන් කරන්නේ නෑ. ඒ නිසා මම විශ්වාස කරනවා විශේෂයෙන් ලොකු කාර්යභාරයක් කරනවා නගරය පිරිසිදුතාවය රැක ගන්න ඒ සෞඛ්‍ය අංශයේ ඉන්න කාර්ය මණ්ඩලයත් එක්කම කරගන්න පුළුවන් නම් ප්‍රමාණවත්. නාගරික ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව ආහාර ප්‍රමිතිය පිළිබඳ ඒවා ක්‍රියාත්මක කිරීමේදී යම්කිසි අඩුපාඩුවක් තියෙනවා. ඒ සම්බන්ධව ඔබ තුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කියලා මං කාරුණිකව ඉල්ලා සිටිනවා.

ඒ වගේම විගණන අංශය, මන්ත්‍රීතුමා කතා කරා වගේ එතුමා ප්‍රකාශ කරා මේ නගර සභාවේ බරපතල ප්‍රශ්නයක් තියෙනවා. එනිසා විගණන අංශය සම්බන්ධයෙන් මේ වෙනකොට මහ නගර සභාවේ වෙච්ච ලොකුම මූල්‍ය වංචාව මේ වෙනකොට තුන් කෝටි විසි ලක්ෂයකට ආසන්න සහ එතනින් එහා ගියපු ගණනක්. මම හිතන්නේ ඒ ගණන තවම ගණනය වෙමින් පවතිනවා කියලා තොරතුරු හෙළි වෙනවා. මේවා විගණන අංශයෙන් පවා සහතික කරලා තියනවනේ විගණන විමසුම් පවා දීලා තියෙනවා. මේවා නිවැරදියි කියලා. ඒ නිසා අපේ කාර්ය භාරය හා ඒ සම්බන්ධව එතකොට යම් කිසිවෙකුට ප්‍රශ්නයක් මතු වෙනවා. මේ විගණන විමසුම් ඉවර නැද්ද කියලා. එහෙම වෙලා තියෙද්දී මේ වගේ දෙයක් සිද්ධ වෙන්නේ කොහොමද කියලා. ඔවුන්ට නගර සභාවෙන් ගෙවීම් කරලා තියෙනවා නං ඒ ගෙවීම්වලට ම පවා ප්‍රශ්නයක් වෙනවා නිසි ඇගයීමක් නොකර ඇගැයීම් ලබන්නේ කොහොමද කියන එක. මොකද නිසි ක්‍රමවේදයකින්

තොරව විගණනය කරලා මුදල් ලබාගැනීම සම්බන්ධයෙන්. ඒ මුදල් අය කිරීම සම්බන්ධයෙන් ඒ ඒකත් විගණනය කළ යුතුයි කියලා මම මේ අවස්ථාවේ දී ප්‍රකාශ කර සිටිනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී සීතා හේරත් මැතිතුමිය.</u>**

ගරු නගරාධිපතිතුමනි, අපේ නියෝජ්‍ය නගරාධිපතිතුමා ප්‍රකාශ කළා වගේ මේ ඩෙංගු උවදුර සම්බන්ධයෙන් ගොඩගේ මාවත ප්‍රදේශයේ අපි ගියා බලන්න. ප්‍රජා ශාලාව තියෙන මෙහා පැත්තේ අයිනේ කානුව තියෙනවා. එතන ගඳයි ඒ හරිය කාමර කුලියට දීමට තිබේ කියලා බෝඩ් එකකුත් ගහලා තියෙනවා. ඇතුලත කානුවක් තියෙනවා දෙපැත්තම ගොඩවෙලා මැද වළක් ඉතිං.....

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

මන්ත්‍රීතුමිය අපි දැන් මේ කටයුතු සම්බන්ධයෙන් කිසිසේත්ම මැදිහත් වෙන්නෙ නෑ අපි නිලධාරීන්ට අවශ්‍ය නිදහස ලබාදීලා තියෙනවා. ඒ අයට අදාල රාජකාරි කටයුතු ඉදිරියට කරගෙන යන්න නඩු පැවරීම් කටයුතු ඒ දඩ මුදල් අය කිරීම් කරන්න. මේ සම්බන්ධව ඉතින් ඒ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් නිලධාරීන් වගකිව යුතුයි.

**<u>ගරු නාගරික මන්ත්‍රී සීතා හේරත් මැතිතුමිය</u>**

ඒ ප්‍රදේශය ඩෙංගු උවදුර හැදිච්ච අය 6 දෙනෙක් ඉන්නවා. ඒ සම්බන්ධයෙන් කඩිනමින් මොකක් හරි ක්‍රියාමාර්ගයක් ගන්න මම ඉල්ලීමක් කරනවා.

ගරු නගරාධිපති තුමනි, තවත් කරුණක් තියෙනවා. ජයන්ති මාවත රේල් පාරෙන් එහා පැත්තේ කාන්තාවක් පොඩි වඩේ කඩයක් කරගෙන ගිහිල්ලා තියෙනවා. නගර සභාවෙන් පුද්ගලයෙක් ගිහිල්ල ඒ වඩේ කරත්තය එතනින් ඉවත් කරන්න කියලා. අවුරුදු දහයක් විතර දැන් ඒ ස්ථානයේ වඩේ කරත්තය තියාගෙන ඉන්නවා. ඒක ඉවත් කරපු නිසා එයා කිසිම ආදායමක් නැතිව ගෙදරට වෙලා ඉන්නවා. මම ගියා බලන්න ස්ථානය කිසිම හානියක් නැහැ කාටවත්.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

ඒ කාන්තාවට කියන්න ඇවිල්ලා මට ඒ පැමිණිල්ල ඉදිරිපත් කරන්න කියලා.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඒ.එම්.පී. අන්සාර් මැතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුමනි, මමත් ගියා බලන්න ඒ විස්තරය දැනගෙන. ඒ අයට වෙනත් ස්ථානයක් ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා.</u>**

ගරු නගරාධිපති තුමනි මේ නගරය ගත්තහම, ප්‍රධාන පාරවල් ගත්තහම ලස්සනට තියෙනවා. ඒ ප්‍රධාන පාරවල් ඇරුනහම අතුරු පාරවල් කිසිම සංවර්ධනයක් වෙලා නැහැ. අද මේ අතුරු පාරවල් වල ව්‍යාපාරික කරන ව්‍යාපාරික මහතුන් ඉන්නවා උදාහරණයක් වශයෙන් ගත්තොත් මාකට් පෙදෙස බැංකු සයිට් ප්‍රදේශ කඩ 50 පෙදෙස ගත්තහම ප්‍රධාන පාරවල් හොඳට තියනවා. අතුරු පාරවල් සම්බන්ධයෙන් නම් ඉතාම

දුර්වල මට්ටමේ තියෙන්නේ. ඒ ඒ ව්‍යාපාර පවත්වාගෙන යන්නේ බොහොම අපහසුවෙන්. වාහනයක් නවත්තන්න බෑ වාහනයක් නවත්තන්න තැනක් නෑ. ඒ නිසාම අපහසුතාවයට පත් වෙනවා. නැවත පෙරළා ඒ ව්‍යාපාර මහතුන්ගෙන් නගර සභාව අය කරන බදු මුදල්, නාම පුවරුව ගාස්තු වෙන්න පුළුවන් ඒවා සොයා ගන්නත් අපහසු තාවයක් තියෙනවා. උදාහරණයක් ගත්තට පස්සේ ඔය මාර්කට් ප්‍රදේශයේ බොහෝ අතුරු පාරවල් එකක්වත් සකස් කරලා නැහැ. ඒ ඉන්න අය අවුරුදු 20 - 30 නගර සභාවට බදු ගෙවනවා. වෙළඳ බලපත්‍රයක් ගෙවනවා. දැන්වීම් පුවරු ගාස්තුත් ගෙවනවා. ඒවා ප්‍රධාන වීදිය නාම පුවරු ගාස්තු ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියට රු.200.00 ක් ගන්නවා. එතකොට අතුරු පාරවල් වල තියෙන ව්‍යාපාර වල ව්‍යාපාරිකයින් ගෙනුත් අර රුපියල් 200.00 අය කරනවා. ඒක හරි අසාධාරණයි. මම කියන්නේ මෙහෙම කරන්න හොඳ නෑ . අතුරු පාරවල් වල ඉන්න අයට මම කියන්නේ එහෙම නම් ප්‍රධාන විදියට නාම පුවරුවට දැන්වීම් ගාස්තු වැඩි වෙන්න ඕනේ. නැත්නම් අතුරු පාරවල්වල ව්‍යාපාර කරන ව්‍යාපාර මහතුන්ගේ වෙළඳ ව්‍යාපාර බලපත්‍ර ගාස්තු ඒ පහසුකම් නැත්නම් අඩු වෙන්න ඕන. මම මේ සභාවට යෝජනා කරනවා වගේ මේ විෂමතාව පොඩ්ඩක් අඩුකරලා සාධාරණ ගාස්තු අය කරන්න කියලා, කාණු පද්ධති නම් එ් පැත්ත සුද්ද වෙන්නෙම නැහැ මමත් ඉන්න නිසා මේ ගැන කියන්නේ.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

අද මේ සභාවේ කවුරුත් නැහැ නිලධාරීන්ට මාසෙකට සැරයක් සභාව තියෙන්නේ නිලධාරි අනිවාර්යයෙන් සභාවට සහභාගි විය යුතුයි. අද කවුද මේ ගැන අහන්නේ මට තමයි දැන් ඔබතුමා කියන දේවල් අහන්න වෙලා තියෙන්නේ.

**<u>ගරු නාගරික මන්ත්‍රී ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා.</u>**

ගරු නගරාධිපති තුමනි, මේ සභාවේ ඇති වෙච්ච පරිපාලන දුර්වලතාවයක් නිසා මේ දවස් වල මූල්‍ය වංචාවක් සිද්ධ වෙලා තියෙනවා. කලින් මන්ත්‍රීතුමාත් මේ සම්බන්ධයෙන් අදහස ඉදිරිපත් කරයි. සභාව තුල ලොකුම වංචා වෙලා තියෙන්නේ මම හිතන්නේ මීට ඉස්සර වෙලා වරිපනම් වංචාවක් වෙලා තියෙනවා. එය වංචාව යට ගහන්න දැන් තව ලොකු වංචාවක් වෙලා තියෙනවා. හෙට දවසේ මීට වඩා ලොකු වංචාවක් සිදු වුනොත්. ඒ නිසා මම මේ සභාවට ඉදිරිපත් කරන්නේ මේ වංචා සිදුවීම වළක්වන්න වැඩපිළිවෙළක් සැලසුමක් සකස් කරන්න කියලා.

**<u>ගරු නාගරික මන්ත්‍රී කේ.ඒ ඉන්ද්‍රාණි මැතිතුමිය.</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා ප්‍රකාශයක් කරා නගරයේ ඉන්න පදික වෙලෙන්දන් සඳහා එකතැනකින් ඒ අයට වෙළදාම් කරන්න අවස්ථාව සකස් කරලා දෙනවා කියලා. මම ඉල්ලීමක් කරන්න. කැමතියි අපේ බල ප්‍රදේශයේ ද පනහකට වැඩිය පදික වෙළෙන්දන් ප්‍රමාණයක් ඉන්නවා. ඒ පැත්තෙන් ඒ අයටත් මේ යෝජනා කළේ විදිහට එක තැනකට ගේන්න ස්ථානයක් සකස් කරලා කටයුතු කළා නම් හොඳයි කියලා.

## ගරු නගරාධිපතිතුමා

මන්ත්‍රීතුමිය අපිට මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා. දැන් අපට පොදු වෙළඳසැල ඒ ආසන්නයේ තියෙන්නේ වර්ග කිලෝමීටර් ප්‍රමාණයක් තියෙනවා. පොදු වෙළඳසැල ආසන්න තිබුනහම ඒ අයට තවත් වෙළෙදාම් කරගෙන යනකොට අසාධාරණයට ලක් වෙනවා. පොදු වෙලදැසැලේ මිනිස්සු අපිට බනිනවා. ඒ අයට ව්‍යාපාරයක් කරගන්න නෑ පාඩු ලබනවා කියලා. දැන් මේ නගරය බක්කි ම නගරයක් වෙනවා. දැන් මේ වෙළෙඳ කුටි ලබාදීමෙන් මේ නගරය අවලස්සන වෙනවා.

## ගරු නාගරික මන්ත්‍රී කේ.ඒ ඉන්ද්‍රානි මැතිතුමිය.

යාපනේ හංදිය ප්‍රදේශයේ ඉන්න පදික වෙලෙන්දන්ට පොදු ස්ථානයක් සකස් කර ලබාදීම සුදුසුයි කියන එක මම කියාසිටිනවා. බොහොම ස්තුතියි.

## ගරු නාගරික මන්ත්‍රී විමල් රවීන්ද්‍ර රණසිංහ මැතිතුමා.

මේ සභාවේ සිදුවෙච්ච මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් ගොඩක් කතා වුණා. හැබැයි මට හිතෙන්නේ මේ මූල්‍ය අක්‍රමිකතා සිදු වෙලා තියෙන්නේ විගණනය තියෙන්නේ උඩ. මගේ යෝජනාවක් තියෙනවා මේ විගණනය පොඩ්ඩක් මෙහෙන් ඈත් කරමු කියලා. එතකොට ඔන්න ඇවිල්ලා මේකේ තියෙන ඒවා හරියට හොයලා බලන්න කටයුතු කරයි. නැත්නම් එහා පැත්තේ තියෙන ඒවා මෙහා පැත්තට හොයාගන්න බැරි වෙනකොට ගතියක් නෑ වගේ තේරෙනවා නේ. ඒක නිසා මම යෝජනාවක් කරනවා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව තියෙන මාකට් එක උඩ ස්ථාපිත කරල තියනවා වගේ රජයේ විගණන ඒකකයත් වෙනත් ස්ථානයකට යොමු කරන්න කියලා එතකොට වත් හරියට මේ විදිහට කටයුතු සිද්ධ වෙයි කියලා.

## ගරු නාගරික මන්ත්‍රී විරාජ් තීක්ෂණ රණවීර මැතිතුමා.

ගරු නගරාධිපතිතුමනි , මම මීට මාසෙකට කලින් යටිතල පහසුකම් පුස්තකාල කටයුතු තොරතුරු තාක්ෂණ පිළිබඳ කමිටුවට යෝජනාවක් යොමු කරනවා නගර සභාවේ සුළු සේවකයන් සම්බන්ධයෙන් විවේකාගාරයක් ඉදි කරන්න කියලා. නමුත් ඒ සම්බන්ධයෙන් තව මොකක්ද වුනේ කියන කාරණය දන්නේ නෑ. ඒ වගේම තමයි ගරු නගරාධිපතිතුමනි, අවුරුදු දෙදහස් පන්සියයකට වඩා වැඩි ඉතිහාසයක් තියෙන

ශ්‍රී මහා බෝධිය වන්දනාමාන කරන්න ලංකාවේ සෑම දෙසින්ම බැතිමතුන් බොහෝ ප්‍රමාණයක් දෛනිකව පැමිණෙනවා. ඒ ඒ බැතිමතුන් යන මාර්ගය විශාල දූවිල්ලක් ඇතිවෙනවා. පැමිණෙන බැතිමතුන් ඒ සම්බන්ධයෙන් සෑහෙන අපහසුතාවකට පත් වෙනවා . බෞද්ධ මන්දිරය අසල තියෙන මාර්ගය.

**<u>ගරු නගරාධිපතිතුමා</u>**

අපි පස් පුරවපු පාර නේ. ඒක පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් තාර දාන්න දෙන්නේ නෑ.. ඒක බොරළු ටිකක් දාලා තද කරලා හරි ගැස්සුවා නම් හරි.

**<u>ගරු නාගරික මන්ත්‍රී තීක්ෂණ විමුක්ති රණවීර මැතිතුමා.</u>**

ඒ මාර්ගය එහෙම සකස් කරන්න කියලා මම යෝජනා කරනවා. ඒ යෝජනාවත් එක්කම තව චෝදනාවක් තියෙනවා. ගරු නගරාධිපති තුමනි මම මැයි මස සභාවට ඉදිරිපත් කරා කල් දී ඇති ප්‍රශ්න යටතේ ප්‍රශ්න වගයක් , නමුත් ඒ ප්‍රශ්න සඳහා පිළිතුරු පසුගිය සභාවට බාගයක් ලැබුණා. ජුනි මාසේ කොටසක් දුන්නා. එය ජවනිකාවක් වශයෙන් කොටසක් දුන්නා. මේ මාසයේ ඉතුරු කොටස දෙන්නම් කියලා පොරොන්දු වුණා. නමුත් ඉතුරු කොටස මේ මාසේ සභාවට ඉදිරිපත් කළේ නැහැ. ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, කියන්න ඕනෑ මේක මේ පරිපාලනය විසින් සභාව හෑල්ලුවට ලක් කිරීමත් තමයි මේ කරන්නේ. ඒ නිසා මීට වඩා මේ සියලුම සභිකයන් ගැන, මේ සභිකයන් විසින් කරන යෝජනා ගැන මීට වඩා උනන්දුවක් දැක්විය යුතුයි.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

මන්ත්‍රීතුමා ඒ සම්බන්ධයෙන් පිළිතුරු සකස් කරල තියෙන්නේ. අද දින න්‍යායපත්‍ර යට ඇතුලත් වෙලා නෑ . අපි ඒක ඔබතුමාට ලැබෙන්න සලස්වන්නම්.

මෙදිනට අදාලව වෙනත් කරුණු සභාවට ඉදිරිපත් කිරීමට නොවූ බැවින්, 2018 සැප්තැම්බර් මස සභා වාරය 04 වන දින බව ප්‍රකාශ කරමින් මෙදිනට නියමිත සභාවේ කටයුතු ගරු නගරාධිපතිතුමා විසින් ප.ව. 01.28 ට අවසන් කරන ලදී.

එච්.පී. සෝමදාස,

නගරාධිපති,

මහා නගර සභාව,

අනුරාධපුරය.